
# සැදෑව

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2013 ජූලි / සැප්. කලාපය.





වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක : QD/55/News/2013 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.


## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සමඟ පැවති සාකච්ඡාව

මෙම සාකච්ජාව 2013 අගෝස්තු මස 22 වෙනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේදී පවත්වන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් සහභාගීවූවෝ**

අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මයා
නියෝජ්‍ය අධිපති ආචාර්‍ය නන්දලාල් වීරසිංහ මයා
නියෝජ්‍ය අධිපති ආනන්ද සිල්වා මයා
සහකාර අධිපති සුනිල් ලංකාතිලක මයා
අතිරේක අධ්‍යක්‍ෂ, මානව සම්පත් දෙපාර්තමේන්තුව W.R.A.ධර්මරත්න මයා

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය වෙනුවෙන් සහභාගීවූවෝ**

සභාපති ලක්‍ෂමන් ද සිල්වා මයා
ලේකම් P.M. රෝසා මයා
භාන්ඩාගාරික W.D.A. රේමන්ඩ් මයා
උප ලේකම් අමරපාල කරසිංහ ආරච්චි මයා
උප භාණ්ඩාගාරික මිලන් ප්‍රනාන්දු මයා
කමිටු සාමාජික C.D.S.ජයවර්ධන මයා
කමිටු සාමාජික R.D.ගුණසේන මයා
කමිටු සාමාජික T.G.. කරුණාදාස මයා



සාකච්ඡාව සඳහා අවස්ථාවක් ලබාදීම ගැන ස්තුතිය පලකළ සභාපති ලක්‍ෂමන් ද සිල්වා මහතා විසින් විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් අතර විශාල විෂමතාවයක් ගොඩ නැගී ඇති බව කරුණු සහිතව අධිපතිතුමා වෙත පෙන්වා දෙන ලදී. එම විෂමතාවයන් වලකනු වස් දෙපාර්ශවය අතර එකඟ වන පසුගිය වසරක් සඳහා සියලුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් යාවත්කාලීන කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙසේ විශ්‍රාම වැටුප් විෂමතාවයන් ඇති බව තමා පිළිගන්නා නමුත්, විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමක් කිසිසේත් කළ නොහැකි බව අධිපතිතුමන්ගේ පිළිතුර විය.

රජය විසින් 2004 වර්ෂයේදී හා 2006 වර්ෂයේදී රජයේ විශ්‍රාම වැටුප් මෙලෙස 1996 වසරට හා 2000 වසරට යාවත්කාලීන කර ඇති බව අදාල චක්‍ර ලේඛන වල පිටපත් අධිපතිතුමා වෙත පිළිගන්වමින් ලක්‍ෂමන් ද සිල්වා මහතා ප්‍රකාශ කළ අතර, එවැනි ක්‍රමවේදයක් මහ බැංකු විශ්‍රාමිකයන් සඳහා ද අදාල කරන ලෙස අධිපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

ඊට එතුමාගේ පිළිතුර වූයේ රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ඉතාමත් අල්ප බවත්, අපට අවශ්‍යනම් රජයේ වැටුප් තල අදාල කරමින් යාවත්කාලීන කළහැකි බවත් ය.

ඊට සංගමයේ විරෝධතාවය හා අකමැත්ත ප්‍රකාශ කරන ලදී. ඉන් අනතුරුව සභාපති මහතා විසින්, තවත් ලේඛනයක් අධිපතිතුමා වෙත ඉදිරිපත් කරමින්, පසුගිය වැටුප් වැඩිවීමට අනුව, පලමු ශ්‍රේණියේ විශ්‍රාමික සුළු සේවයකුගේ විශ්‍රාම වැටුප් වැඩි වූයේ රු.328/- න් බවත් විශ්‍රාමික නියෝජ්‍ය අධිපති වරයකුගේ විශ්‍රාම වැටුප් වැඩි වූයේ රු.2,408/- න් බවත් ප්‍රකාශ කරන ලදී. මෙම මුදල වැඩිවූ විදුලිය බිල ගෙවීමටත් ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කරන ලදී. ගෑස් මිල, ආහාර ද්‍රව්‍ය වල මිල, විශේෂයෙන් බෙහෙත් මිලේ වැඩිවීමට මුහුණ දීමට මෙය කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පෙන්වා දෙන ලදී.

ඊට පිළිතුරු ලෙස සහකාර අධිපති ලංකාතිලක මහතා ප්‍රකාශ කර සිටියේ ජීවන වියදම් දීමනාව ලබා දෙනුයේ ඒනිසා බවයි. අනිකුත් වාණිජ බැංකුවල විශ්‍රාමිකයින්ට ලැබෙනුයේ ස්ථාවර ජීවන වියදම් දීමනාවක් බවද ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් අනතුරුව තවත් ලේඛනයක් ඉදිරිපත් කරමින් සභාපති මහතා අධිපතිතුමා වෙත දක්වා සිටියේ 1990 පෙර විශ්‍රාම ගිය අය සඳහා 20% ක අනුපාතයකින් විශ්‍රාම වැටුප් වැඩි කළත් සංඛ්‍යාත්මකව එහි වටිනාකම ඉතාමත් අල්ප බවයි. උදා: වශයෙන් 1984 දී විශ්‍රාම ගිය 2 ශ්‍රේණියේ සුළු සේවකයකුගේ විශ්‍රාම වැටුප වැඩි වූයේ රු.789/- න් පමණක් බවත් 1977 දී විශ්‍රාමගිය දෙපාර්තමේන්තු ප්‍රධානියකුගේ විශ්‍රාම වැටුප වැඩි වූයේ රු.2,216/- ක් බවත්ය.

ඊට අධිපතිතුමා පිළිතුරු වශයෙන් ආසන්නයෙන්ම විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපති ප්‍රේමරත්න මියගේත් , ඊට අවුරුදු 27 කට පෙර විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිවරයෙකු වූ හෙක්ටර් ප්‍රේමරත්න මහතාගේත් විශ්‍රාම වැටුප් සංසන්ධනය කර පෙන්වන ලදී. ඔහු කියා සිටියේ තව අවුරුදු 27 න් වර්තමානයේ විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිගේ විශ්‍රාම වැටුප ද එවැනිම ඉරනමකට භාජනය වන බවය.

සභාපති විසින් මීලඟට අධිපතිතුමා වෙත පෙන්වා දෙන ලද්දේ 2000 ට පසු විශ්‍රාම ගිය අයගෙන් කොටසකට එනම් 2000 ත් 2005 ත් අතර විශ්‍රාම ගිය අයට සිදුවූ අසාධාරණය ගැනයි. එනම්, 2000 ට පසු විශ්‍රාම ගිය අයට 5% කින් විශ්‍රාම වැටුප් වැඩිකළ විට, 2006, 2007, 2008, 2009, 2010, 2011, යන වසර වල, විශ්‍රාම ගිය නමුත්, විශාල විශ්‍රාම වැටුප් වලට හිමිකම් කී ඒ අයටත් 5% න් වැඩිවිය. ඒ අයගේ විශ්‍රාම වැටුප් සාපේක්ෂව විශාල බැවින් 2000 න් 2005 ත් අතර විශ්‍රාම ගිය අයට වඩා විශාල වැඩිවීමක් ඒ අය ලබා ගන්නා ලදී. එහෙයින්, මීට පිළියමක් වශයන් 2000 ත් 2005 ත් අතර විශ්‍රාම ගිය අය සඳහා 10% ක අනුපාතයක් අදාල කරන ලෙස ඉල්ලා සිටින ලදී.

දැනට විශ්‍රාම වැටුප් වැඩිකර ඇති බැවින් නැවත සංසෝධන කළ නොහැකි බව පවසන ලදී. මීලඟ වැඩි කිරීමේදී එය සැලකිල්ලට භාජනය කරන බව දන්වා සිටින ලදී.

තවද, මීලඟ විශ්‍රාම වැටුප් සංශෝධනයේදී අදාල කර ගත හැකි සුදුසු ක්‍රමවේදයක් අපට යෝජනා කරන ලෙසටද දන්වා සිටින ලදී.

මීට අමතරව, රටේ වැඩිහිටි ජනගහනයේ වර්ධනය ගැනද කරුණු ඉදිරිපත් කර, විශ්‍රාම වයස් සීමාව දීර්ග කිරීමට ඉදිරියේදී පියවර ගැනීමට ඉඩ ඇති බවට ද ඉගියක් පලවිය. මේ සම්බන්ධයෙන් සංගමයේ උප ලේකම් කරසිංහ ආරච්චි මහතා ද මහ බැංකු වාර්ථාව උපුටා දක්වමින් කරුණු ඉදිරිපත් කරන ලදී.

විශ්‍රාමිකයින්ගේ වාර්ෂික විනෝද චාරිකාවේ ප්‍රවාහන ගාස්තු මහ බැංකුව මගින් දරණ ලෙසට අප විසින් කරන ලද ඉල්ලීමට අධිපතිතුමාගේ කැමැත්ත පලවිය.

පැයකට ආසන්න කාලයක් පැවැත්වූ සාකච්ඡාව ඉන් නිමාවට පත්විය.



වාර්තා කළේ - ලක්ෂමන් ද සිල්වා

## The discussion Central Bank Pensioners' Association held with the Governor of the Central Bank of Sri Lanka

The discussion was held at the Central Bank building on 22nd August 2013, and those who participated were,

**On behalf of the Central Bank**

Governor Mr. Ajith Nivard Cabraal
Deputy Governor Dr. Nandalal Weerasinghe
Deputy Governor Mr.Ananda Silva
Assistant Governor Mr. Sunil Lankathilaka
Additional Director of Human Resources Department
Mr. W.R.A. Dharmaratne

**On behalf of the Central Bank Pensioners' Association**
President Mr. Lakshman de Silva
Secretary Mr. P. M. Rosa
Treasurer Mr. W.D.A.Raymond
Assistant Secretary Mr. Amarapala Karasinghe Arachchi
Assistant Treasurer Mr. Milan Fernando
Committee Member Mr. C.D.S. Jayawardena
Committee Member Mr. R.D. Gunasena
Committee Member Mr. T.G.. Karunadasa



After thanking the Governor for the opportunity given for holding of the discussion, Association President Mr. Lakshman de Silva proceeded to point out to the Governor that a big anomaly has got formed over the past years in the pensions that are paid. As a rectifying measure, he suggested to the Governor that an updating of pensions of all pensioners be done with respect to a chosen year and in a manner aggreable to both parties.

The Governor's reply was although he accepted there are anomalies in pension payments, he is unable to up date in any way the pensions already given.

There after presenting copies of documents relating to the updating of Govt. pensions twice by the Govt. in 2004 and 2006 using 1996 and 2000 as base years, the president Lakshman de Silva said to the Governor a similar method of pension increase could be adopted with regard to Central Bank pensioners also. Governor was not in favour of this proposal and when on to say that the pensions of the govt: servants are very low on compared to Central Bank employees who draw much higher salaries.

Then the president showing papers of quoted figures relating to past pension increases in the Central Bank, told the Governor that in the latest revision, a grade 1 minor employee got an increase as little as Rs.328/- and that a Deputy Governor got the pension increased by Rs.2,408/-. The President made it the opportunity to say such increases are not at all enough to cope up with price increases in electricity, gas, food items, medicines etc.

In reply to it Asst. Governor Mr. Lankathilaka said cost of living allowance is given for that reason. He also said that pensioners of other Commercial banks get only a fixed cost of living allowance.

Drawing the attention of the Governor to another set of figures the President said although a 20% pension increase has been given to those who retired prior to 1990, numerically its value was little indeed. As an example the pension of a grade 2 minor employee who retired in 1984 was only Rs. 789/- and the pension increase a head of a dept. who retired on 1977 was only Rs.2216/-.

In reply to president the Governor compared and showed the pensions of Deputy Governor who retired recently and Deputy Governor who retired 27 years later Governer therefore commented that the pension of the Deputy Governor who retires now will also be subjected to a similar fate unavoidably.

The next thing the president pointed out to the Governor was that an injustice has been done to those who retired between the years 2000 and 2005, in giving pension increases. They have been offered only 5% increases when those who retired with much bigger pensions after 2005 also got an increase of 5%, further widening the gap of the two groups. As a rectification the President suggested that a 10% ratio be made relavent to the category between 2000 and 2005. The Governor said because the increase has been already given it cannot be amended now.

However he expressed willingness to take it consider this issue the next increase. Speaking further the Governor expressed the openion that in future, employment institutions will have to extend the retirement age of workers to something like 65 or even more. The Governor said so when the assistent secretary of the Association Mr. Karasinghe Arachchi quoting from the Central Bank Report said that in the near future there is to be an excess of elderly population in the country. The Governor was also considerate enough to request us to suggest a suitable formula or method to be considered for application in the next pension amendment.

Lastly a request was made from the Governor, by the president to finance the cost of transport from the bank for the bi - annual trips made by the members of the association. The Governor consented to grant the request.

With that offer by the Governor, the discussion which went on for about one hour came to an end.



**Reported by -**
**Lakshman de Silva**

# එක් දින චාරිකාව



මෙම වසරේ අපගේ එක් දින චාරිකාව යොදා ගැනුනේ කොළඹ මීගමු පාරට නුදුරු උස්වැටකෙයියාව මුහුදු වෙරලටය. එහි පාම් බීච් නම් හෝටලය අප එක් රැස්වූ ස්ථානයයි.

පසුගිය අගෝස්තු 11 වෙනි ඉරුදින උදේ 10.00 ට අපි එහි ගියෙමු. මහරගම ගල්කිස්ස යන තැන් සිට සංගමය යෙදූ බස් වලින්ද පුද්ගලික වාහන වලින්ද අපගේ සාමාජික සාමාජිකාවන් 115 ක් දෙනා කලට වේලාවට එහි පැමිණියෝය. එකට සේවය කළ හිතවතුන් හිත වතියන් හා එක්ව දවස ගෙවීමේ උද්යෝගී අපේක්ෂාව කා තුලත් දක්නට ලැබිණ.

පාම් බීච් හෝටල් පරිසරය ඊටම ගැලපුනා සේය. එය මුහුදු වෙරලට මුහුණලා ඊට යාබදව පිහිටි ඉඩ පාඩු සහ සුව පහසු තැනකි. තරමක් විශාල ඉඩමේ තැන් තැන්හී පිහිටි ආසන මුහුදු සුළගේ පහස විඳිමින් හිස් කලංක සල්ලාපය සඳහා මොනවට ගැලපුනේය. එහෙත් අපගේ, සාමාජික පිරිස වඩාත් රුචි වූයේ හෝටලයට නුදුරුව තරමක් විශාලව වැඩී සෙවන සහිත වෘක්ෂයක් යට එක්ව සිටීමටය. හෝටලයට පැමිණ කෙටි ආහාරයකින් පසුව ඔවුහු එහි රැස්ව මනාප ලෙස අතීත ආවර්ජනයේ යෙදුනි.

එම සුහද බස් හුවමාරුවෙන් පැයකට පමණ පසුව හුදු විනෝදාස්වාදය පතා වැගොඩපොල මහත්මිය, විසින් සූදානම් කර තිබූ සැහැල්ලු ක්‍රීඩා කීපයක් පැවැත් විය. එම ක්‍රීඩා අතුරෙන් දෙහි ගෙඩි සහ වම්බොටු කරල් යොදාගත්



ක්‍රීඩාව වඩාත් හාස්‍ය රසය ඇති කළේය. නූලක බැඳි වම්බොටුටෙන් නූල මගින්ම බිම තැබූ දෙහි ගෙඩියට තට්ටු කර එය දිණුම් රේඛාවට අන් අයට කලින් ගෙන යාම තරඟකරුගේ දක්ෂකම විය. සමහරුන්ගේ දෙහි වම්බොටු පහරට අවනත වූයේම නැත. එහෙත් තරඟ වලදී දක්ෂයෝද වූහ. ඔවුන්ට තෑගිද ලැබිණ.

දවල් ආහාරයට කලින් ඇතැම් අය එක්ව කණ්ඩායම් සෑදී මත් දියෙන් දිව උගුරු තෙමන බව පෙනින. එයින් ඔවුන් අතර සතුටු සාමීචිය යලිත් පන ගැන්වී තිබිණ. එසේ වුවද ඔවුන්ද අන් අය මෙන්, එයට වෙන් කර තිබූ 12.00 ත් 2.00 ත් අතර කාල සීමාවේදී දිවා ආහාරය ගත්හ.

දිවා ආහාරයෙන් මඳකට පසුව ඉහත කී ගස යටට සියල්ලෝම එක්වූහ. ඒ අපගේ දයාබර සාමාජික පිරිසේ හුදු ආශ්වාදය සඳහා සංගීත වැඩ සටහනක යෙදීමටය. එයට මුල පුරන ලද්දේ හෝටලයට අයත් කුඩා සංගීත කණ්ඩායම මගින් ගැයුම් දෙක තුනක් ඉදිරිපත් කිරීමෙන්ය. ඉන් පසුව ගැයීමේ හැකියාවෙන් යුත් සාමාජිකයින් කීප දෙනෙක් ගැයුම් සඳහා ඉදිරිපත් වූහ. ඔවුන්ගේ ගීත වැඩියක් ජනප්‍රිය පැරණි ගීත වූ බැවින් බොහෝදෙනෙක් ඉන් රස වින්දෝය.

සංගීත වැඩ සටහනින් පසුව තේ පැන් සංග්‍රහයක් විය. එහි අවසානයේ සවස හතරට, සියල්ලෝම හෝටලයෙන් පිටත්ව ගියෝය. ඔවුන්



හමුවේ රසය තොල ගාමින්........

බොහෝ දෙනෙක් සභාපති ලක්ෂ්මන් මහතාට ස්තුති, කොට ගියේ සැබවින්ම චාරිකාවෙන් සතුටක් ආශ්වාදයක් ලද බව හඟවමින්ය. ඇතැමෙක් සෘජුවමත් චාරිකාව සඳහා තෝරා තිබූ ස්ථානය ගැන පැහැදීමෙන් කථා කර තිබුණි.



ආගිය තොරතුරු රහ බලමින්........

සිද්ධියක් ගැන විමසුමින්........





දෙසුමක රහ විඳිමින්........

සටහන - ඩබ්.ඩී.ඒ. රේමන් - ඡායාරූප - යසනායක සිරිවර්ධන

# දූෂණය පෝෂණය = නීතිය බිඳ දැමීම

## නිමිත්ත

'**සැඳෑව**' පසුගිය කලාපයේ 'ගෝලීය අත්දැකීම් ගෝලය' විශේෂාංගයේ '**ඇත්තටම ඇමෙරිකාව**' නම් ලිපියේ, මාර්ග නීති අකුරටම කියන උප ශීර්ෂය යටතේ ලේඛිකාව වැදගත් දෙයක් සටහන් කළා. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන අපගේ අවධානය රටක මූලික නීතිය, සමාජ නීතිය, ලෝක නීතිය, දේව නීතිය, ප්‍රාදේශීය නීතිය, පුද්ගල නීතිය හෝ අප අපේ නීතියක් ගැනවත් අවධානය යොමු කරනවා නම් හොඳයි කියලා හිතුනෙ මෙන්න මේ සටහන නිසයි.

**"මෙහේ (අමෙරිකාවේ) වාහනවලට හෝන් පාවිච්චි කරන්න වුවමනාවක් නෑ. හැමෝම යන්නේ මාර්ග නීති අකුරටම පිළිපදිමින්. නීති කඩාගෙන එහෙන් මෙහෙන් වාහන පදවන රියැදුරන් මේ රටේ නෑ"**



ප්‍රේමා චන්ද්‍රසේන
සැඳෑව -
2013 මැයි/ජූනි කලාපය-

## ප්‍රවේශය

දූෂණය කියන වචනය බොහොම හැඟුවුම්කාරක වචනයක්. නොයෙක් නොයෙක් දිශානතියන්ට කුතුහලය ඩැහැගෙන යන්න සමත් වචනයක්. සමහර ප්‍රකට ජනමාධ්‍ය මඟින් දූපත් මානසිකය පෝෂණය කරලා තියෙන්නෙ වෙළෙඳපොල ආකර්ෂණය කේන්ද්‍ර කරගෙනයි. දූපත් මානසිකයන්ට දූෂණය කියන වචනය සීමාසහිත සරළ අර්ථයක්. ඒත් ඊට වඩා ගැඹුරු පුළුල් අර්ථයකින් 'දූෂණය' ගැන ලෝකයම දොඩමළු වෙලා. ඒ දූෂණය 'Pollution' කියන අර්ථයෙනුයි. තව දුරටත් සරළ විදියට කියනව නම් ජල දූෂණය,(මේ දවස්වල රජරට හා රතුපස්වල) වායු දූෂණය, ප්‍රාංශු දූෂණය, පරිසර දූෂණය, ශබ්ද දූෂණයන් වැනි මානව සංහතියටම බලපාන දූෂණය තමයි 'Pollution' කියන පුළුල් අර්ථයෙන් කියවෙන්නෙ. දැන් දැන් පරිසර දූෂණය ගැන වැඩි පිරිසක් '**ටිකක්**' කථා වෙනව. බලධාරීන් ඒ සඳහා සම්මුතිවලට එළඹෙනවා. නීති රීති සම්පාදනය කරනව. ඒත් දූෂණය අඩුවෙන්නේ නෑ.


ඇමෙරිකාවෙ රථවාහනවලින් එන ශබ්ද දූෂණය නැත්තෙ ඒ රටේ 'ප්‍රවාහන' නීති රීති නිසිලෙස ක්‍රියාත්මක කෙරෙන නිසා බව පැහැදිලියි. මෝටර් රථයේ හෝන් ගහන්නෙ නැත්තේ 'හෝන් ගහනම්' කියල නීතියක් පනවපු නිසා නෙමෙයි. එහෙම නීතියක් නැහැ. හැබැයි හැම රියැදුරෙක්ම මාර්ග නීති අකුරටම පිළිපදින නිසා මාවතේ දෝස සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා හෝන් ගහන්න ඕන නැහැ. ඒත් හොන් එකෙන්ම වාහනය දුවවන අපේ රටේ රියැදුරන් අතින් දිනකට සාමාන්‍ය වශයෙන් ජීවිත 3 - 6 අතර ප්‍රමාණයක් විනාශ වී යන බව පොලිස් වාර්තා වලින්ම දැක්වෙනව. දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කරලා අවුරුදු 2 ක් ගත වෙන කොට වැරදි සහගත, නීතිවිරෝධී ධාවන 16,000 ක් හා ජීවිත හානි 13 ක් වාර්තා වෙනවා. මාර්ග නීති රීති ආරක්‍ෂා කරමින් ක්‍රියාත්මක කිරීමට සිටින පොලිසියටත් '**නීතිය කැඩීම**' නොපෙනෙන ගානටම සාමාන්‍යකරණය වෙලා. නැත්නම් ප්‍රාදේශීය දේශපාලන බලවතා ඇවිල්ල පොලිස් රිමාන්ඩ් භාරයේ සිටින වරෙන්තුකරුවෙකු මුදාගෙන යයිද? මෙය පොලිසීයේ අසමත්භාවය ද කියලත් හිතෙනව.

## මන්ද බුද්ධික ද ?

මිනිසා සමාජගත වීමත් සමඟ නීති රීති සකස් කර ගත්තෙ සමාජයේම යහ පැවැත්මටමයි. ඒ බව පුන පුනා සිහි කැඳවීමට තරම් වත්මන් සමාජය අශිලාචාරයි, අත්තනෝමතිකයි, අසංවරයි, අකෘතඥයි, ආත්මාර්ථකාමියි, වනචාරි යුගය කරා පසුගාමියි.

දිනක් රූපවාහිණී සම්මුඛ සාකච්ඡාවකදී ගරු පූජ්‍යපාද මාදුළුවාවේ සෝභිත හිමිපාණන් විසින් වර්තමාන ලාංකිය සමාජ දේශපාලන අලකලංචිය ගැන සඳහන් කරමින් ප්‍රශ්න කළේ "... **ඇත්තටම ශ්‍රී ලංකාවෙ මිනිස්සු මන්දබුද්ධික ද** ?" කියායි. මැතිවරණයක් කියන්නෙම නීති කැඩීමක රේස් එකක්. එසේ හෙයින් නීතිගරුක සමාජයකත්, නීතිවරන සමාජයකත්, නීති කඩන සමාජයකත්, නීතිය වල්වැදුනු සමාජයකත් හැඩ රුව හඳුනා ගැනීම සඳහා '**මානව නීතිය**' ට ඇහැ කණ දිගේලි කරන්නම වෙනව. දර කෑල්ලකට ගිනි ඇවිලුනාම දර කෑල්ල දන්නෙ නෑ ඒක ටිකෙන් ටික පිච්චිලා අලු දූලි වෙලා යන බව.

## නීතියේ සම්භවය ..?



ගල් ගුහාවෙන් එළියට ආපු ප්‍රාථමික මිනිසා ක්‍රම ක්‍රමයෙන් සමාජගත වෙනවා. මිනිසා සංස්කෘතික සත්වයෙක් වෙන්නෙ ඉන් පස්සෙදියි. ඒ සමගම ඇති වෙනව සමාජ සම්බන්ධතා ජාලයක්, සරළ ස්වරූපයක් ගත්තත් ඒ සම්බන්ධතා ජාලය සංකීර්ණයි. මිනිසා

සංස්කෘතික සත්වයෙක් ලෙස ශිෂ්ඨ සම්පන්න වෙන්න වෙන්නම කිසියම් සමාජ හැඩගැසීම් හා මෙහෙයවීම් රටාවක් අනුගමනය කරන්න පෙළඹෙනව. ඒ හැඩ ගැසීම් රටාව තුළ විවිධ ඇදහීම් හා විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර, සාරධර්ම, පුදපූජා හා යාඥා, ගරු සරු දැක්වීම් වැනි විවිධ සමාජ සම්බන්ධතා දකින්න තියෙනවා. කාලයාගේ ඇවෑමෙන් මේ හැඩගැසීම් වලින් කළ යුතු දේවල් චාරිත්‍ර ලෙසත්, නොකළ යුතු දේවල් වාරිත්‍ර ලෙසත් සමාජ පිළිගැනීම බවට පත් වෙනව.

තවත් කාලයකට පස්සෙ නීති රීති බවට පත්වෙන්නෙ මේ සමාජ නිෂ්පාදනයි. දීර්ඝ කාලයක පටන් සමස්ත සමාජය විසින් අනුගමනය කොට පිළිගත් සිරිත් විරිත්, සාරධර්ම සහ අගෑයීම් නොතකා නොසලකා හරිමින් ඒවා කඩ කිරීම මුළු මහත් සමාජයටම එරෙහිවීමක් බව විධිමත් සමාජයේ පිළිගැනීමයි. **නීතිය නැතිවීම හීතිය ඇතිවීමක් බව තේරෙන්නෙ කල් පහු වෙලා**. ප්‍රමාද වෙලා.

## නීතිය යනු ....?



සිලාචාර සමාජය බොහෝ විට සම්මත කර ගන්නා ලද **නීති රීති, පාවිච්චි කරන්නේ සමාජයේ යහපැවැත්ම** වෙනුවෙන්. ඒත් '**බලය**' නම් වූ සාධකය සංකේන්ද්‍රණය කර ගන්නා දේශපාලන සංස්ථාවේ අවභාවිතාව (mis-use) නිසා නීතිය යහපැවැත්ම සඳහාම නිෂ්පාදනය වූවක්දැයි කුකුසක් පවතිනවා. කෙසේ නමුත් නීතිය පිළිබඳව නිමක් නැති නිර්වචන අතරින් ප්‍රකට මෙන්ම මධ්‍යස්ථ හා නොකිලිටි නිර්වචන කිපයක් පහතින් දැක්වෙනව.

1) "**නීතිය යනු තාර්කික බුද්ධියේ උත්තරීතර ප්‍රතිඵලයකි.**" - **ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්**
(ඇරිස්ටෝටල් පඬිවරයා නීතිය උත්තරීතර වූ දෙයක් ලෙස සිතුවේ ඔහු ජීවත් වූ රාජ්‍ය ක්‍රමය තුළ පාලන බලය හිමිකර දෙනු ලැබුවේ උගතුන්ට විනා වංචාකාරයන්ට, කැලෑ පාළුවන්ට, බොරුකාරයන්ට, හොරුන්ට, චන්ඩින්ට, කසිප්පුවන්ට, බාලාපචාරීන්ට, ස්ත්‍රී දූෂකයන්ට හෝ කළුසල්ලිහිමි ධනවතුන්ට නොවන නිසායි. **එදා කිසිම අපචාරියෙකුටවත් නාමයෝජනා දුන්නේ නෑ.**)

2) "**ආශාවන්ගෙන් බලපෑම් නොලත් තාර්කික බුද්ධිය වනාහි නීතියයි -**"-**ඇරිස්ටෝටල්** - (බුද්ධිමත්, උගත්, ජනහිතකාමී පාලකයා නීති සම්පාදනයේදී සිය පෞද්ගලික ආශාවන් අතහැර දමා තාර්කික බුද්ධියෙන් යුතුව නීති සම්පාදනය කරමින් ක්‍රියාවේ යොදන බව මින් අවධාරණය කෙරෙනව).

3) "**නීතිය යනු සමාජයේ පැවැත්ම සඳහා අවශ්‍ය වන්නා වූ කොන්දේසි සමුදායක-**" - **හැරල්ඩ් ලැස්කි** - (නීතිය වචන සමූහයක් නොවන අතර,එය සැබෑවන්නේ ඊට රටේ මහජනතාවගේ පිළිගැනීමක් ඇති වූ විට පමණකි.)

4) "**නීතිය වූකලී දේපල ක්‍රමය මත බිහිවූ රාජ්‍යය නැමති ප්‍රජා පීඩක උපකරණයේ ඍජු ප්‍රතිඵලයක**"
**- කාල් මාක්ස්-**

5) "**සමාජීය ජීවියෙකු වශයෙන් තවත් අයෙකුට හානියක් නොවන අයුරින් තම සිතැඟි ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුත්තේ කෙසේ දැයි පෙන්වනු ලබන මූලධර්ම පද්ධතිය වනාහි නීතිය ය**"
**-සමාජ විද්‍යාඥයෝ-**

ප්‍රකට දේශපාලන විද්‍යාඥයන්ගේත් (වර්තමාන කුප්‍රකට **මගෝඩිස්වරුන්** (Knave) දේශපාළුවන් මිස දේශපාලනඥයන් නොවේ) සමාජ විද්‍යාඥයන්ගේත්, දාර්ශනිකයන් හා චින්තකයන්ගේත් පැහැදිලි කිරීම්වලට අනුව නීතිය පිළිබඳව නිර්වචන රාශියක් ඇතත්, ඒ සියල්ලම මගින් කියවෙන්නේ සමාජයේ යහපැවැත්ම සඳහාම පමණක් නීතිය පිහිට වන බවයි.

## නීතිය බිඳ වැටෙන්නේ නම් ... ?



සමාජය මකුළු දැලක් වගෙයි, (Society is the Web) මකුළු දැලේ හැම නූලක්ම එකිනෙක නූල්වලට සම්බන්ධයි. ඒ නිසා එක නූලක්වත් කැඩුනොත් සමස්ත මකුළු දැලම දෙදරණව. පැද්දෙනව. වෙවුළුම් දෙනවා. චංචල වෙනව. අවසානයේ දී බිඳවැටෙනව. වෙනස් වෙනව. සමාජය නැමැති මකුළු දැලත් එහෙමයි. ඒකෙත් අරවගේ ආර්ථික නූල, සංස්කෘතික නූල, දේශපාලන නූල, සමාජීය නූල වගේ ප්‍රධාන නූල් තියෙනවා. ඒ වගේම ඒ ප්‍රධාන නූල් අතරෙ කුඩා කුඩා නූල් වලින් කුඩා කුඩා කොටු හැදිල තියෙනවා. උදාහරණ විදියට ආගමික නූල, අධ්‍යාපන නූල, ආර්ථික මර්මස්ථාන නූල, ගනු දෙනු නූල, මිල පිළිබඳ නූල, සෞඛ්‍ය නූල, ලෙඩ රෝග නූල, බේත් හේත් නූල, ගමනා ගමන නූල, විවාහ සංස්ථා නූල, දෑවැදි නූල, රැකිරක්ෂා නූල, පුද පූජා නූල, වැටුප්පත පිළිබඳ නූල වගේම සකලවිධ නීති රීති පිළිබඳ නූලත් මේ සමාජ දැලේ තියෙනවා. ඒ එක නූලක් හෝ කැඩී

ගියොත් සමාජය නැමැති ඒකීය දැල වංචල වෙලා, සලිත වෙලා, කුඩුපට්ටම් වෙනව. ඒ බව අමුතුවෙන්ම කිවයුතු වෙන්නෙ අසංවේදී මිනිස්සුන්ටම විතරයි. අනික් හැමෝටම තේරෙන්න ඕන, එක සමාජ සංස්ථාවක් බිඳ වැටීමෙන් සමස්ත සමාජයම ජරාජීර්ණ වෙනව කියල. **විශේෂයෙන්ම නීතිය බිඳ වැටුනොත් සමස්ත සමාජයටම ඉන් සිදුවන හානිය ගණනය කළ නොහැකිය**. ඒ වගේම නීතිය බිඳ නොවැටෙන, නීතිගරුක සමාජය කෙතරම් ප්‍රසාද ජනකද කියල හෝන් නොගසන ප්‍රවාහන සේවා සහිත "ඇත්තටම ඇමෙරිකාව" ? ලිපියෙන් පැහැදිලියි.

වාහන දුවන්නෙ ඉන්ධන වලින්ද, නැත්නම් හෝන් එකෙන්ද කියල තේරුම් ගැනීමට බැරි තරමටම ශ්‍රී ලංකා ප්‍රවාහන සේවාව බිඳ වැටිල. ශබ්ද දූෂණය ඉහවහා ගිය ශ්‍රී ලංකා සමාජය තුළ වෙසෙන විශ්‍රාමිකයන් වන අප අතිනුත් මේ දූෂණය සිද්ධ වෙනව නම් එය මග හරවා ගැනීමට මෙතැන් පටන්වත් වෙර දරමු. නීතිය ශබ්ද දූෂණයට පමණක් සීමා නොකොට සකලවිධ සමාජ නීතියටම එදා මෙන්ම අදත්, අද මෙන්ම හෙටත් ගරු කරමු. ඒ අන්කිසිවක් නිසා නොව මේ නීති පද්ධතිය බිහි වී ඇත්තේ සමස්ත සමාජයේම යහපැවැත්මට නිසා බව අපට දැනෙන නිසාවෙනි.

## නීතිය හා සදාචාරය



සමාජයේ පොදු පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික සේවාවන් විධිමත්ව, කාර්යක්‍ෂමව හා බිඳ නොවැටෙන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුමයි. ඒ වෙනුවෙන් යුක්ති සහගත හා සාධාරණ මෙන්ම පොදු පිළිගැනීමක් පවතින ( අබමල් රේණුවකවත් සැකකිරීමක් ඇති නොවන) සමාජ ආරක්ෂණ සේවාවක් තිබීම හරිම වැදගත්. එහෙම වුනාම රාජ්‍ය පරිපාලනයේ මහාපොදු සාධකය '**සදාචාරය**' හැටියට තේරුම් කර ගන්න පුළුවන්. තවත් විදියකට කියනව නම් '**යහ පාලනය**' කියන්නෙ මේකටම තමයි.

මෙහෙම සමාජයක් කොහෙද තිබුණෙ ? මේක සිහින දැකීමක්. ලෝකෙ කවදාවත් කිසිම රටක ඔය විදියෙ යහපාලන ක්‍රමයක් තිබුණෙ නැහැ කියල පොත පත නොකියවන, නොසිතන හෝ නොසොයන කෙනෙකු තර්ක කරන්න පුළුවන්. ඒත් ඒ විදියෙ නීති ගරුක , ශිලාචාර, සදාචාරාත්මක, ගුණගරුක, වැඩිම ස්ත්‍රී දූෂණ සංඛ්‍යාවක් සිදු කිරීම සම්බන්ධයෙන් සැමරුම් පාටි නොදමන යහපාලනයක් පැවති රාජ්‍ය පාලනයක් ගැන විදාගම මෛත්‍රිය මහ හිමිපාණන් විසින් බුදුගුණ අලංකාරයේ 38 වන කවියේ මෙහෙම සඳහන් කරනව.

'දුසිරිත සිත නැවැ ති
රද නීති දත් ගුණ ඇ ති
මැදහත් ලෙස පැව ති
එරජ ලිච්ජවි නිරිඳු නම් වෙ ති'

දුසිරිත් ලෙස සමාජය හඳුනාගෙන ඇති අපචාර, බාලාපචාර, මත් ද්‍රව්‍ය මගින් මුදල් සෙවීම හොරමුදල් ගනුදෙනු, හොරමුදල් නෝට්ටු මුද්‍රණය කිරීම්, බදු වංචා, කුලියට මිනී මැරුම්, ලිංගික අල්ලස්, ඉඩ කඩම් මංකොල්ල කෑම්, වැරදිකරුවන් ආරක්‍ෂා කිරීම්, විරුද්ධ මත දරන්නන් පැහැර ගෙන යෑම්, ඝාතනය කිරීම්, පොදු බදු මුදල් අයථා ලෙස පරිහරණය කිරීම වැනි කී නොකී අවභාවිතයන්ගෙන් මුළුමණින්ම ඈත් වෙලා. ඒ වගේම ඒ අය රටේ හැමෝම පිළිගන්න රාජ නීතිය ගැනත්, එහි යහපත ගැනත් හොඳින් දන්නව. (තම තමන්ට ඕන ඕන විදියට ඒ නීති රීති සංශෝධනය කරන මුවාවෙන් වෙනස් කරන්න යන්නෙ නෑ) ඒ පාලකයන් සිය පාලිතයන් හැමෝටම එක සමානව සලකනව. තම ඥාතීන්ට, මිතුරන්ට, ආධාරකරුවන්ට, වන්දිභට්ටයන්ට හෙවත් කඩේ යන උදවියට විශේෂ කොට වරප්‍රසාද පිරිනමන්නේ නැහැ. ඔවුන් හැමෝටම මධ්‍යස්ථයි. එහෙම නම් මේ මධ්‍යස්ථ රජවරු වෙන කවුරුවත් නෙමෙයි සිරුරින් පැහැපත්, නිතරම ඇත්ත කථා කරන ලිච්ඡවි රජදරුවන් තමයි.

ඒ ලිච්ඡවි රජදරුවන් දිවි හිමියෙන්ම නීති ගරුකයි. පරමාදර්ශීයි, සදාචාරාත්මකයි, ඒ නිසාම ඒ සමාජය පූර්ණ නිදහස වාංදමන සමාජයක්.

වරෙක මහාචාර්ය **හැරල්ඩ් ලැස්කි** මෙන්න මෙහෙම සඳහනක් කරනව .." **මිනිසාට තමාගේ පෞද්ගලිකත්වය ආරක්‍ෂා කරගෙන කටයුතු කළ හැකි පරිදි ඇති වන පරිසරයේ ආරක්‍ෂා සහිත බව සදාචාරය හෙවත් නිදහසයි**.." කියල. ඒ කියන්නේ සදාචාරාත්මකබව, නීතිගරුකබව, ස්වාධීනත්වය එකිනෙකට සහසම්බන්ධතාවයක් ඇති සමාජ උපකරණ කීපයක් බව පේනව. එහෙම නම් හැමදාම හැම විටකම, හැම තැනකදීම, අප හැමෝම නීතියට අනුකූලව හැසිරෙන්න ඕන. ඒ වගේම කවදාහරි, කොයි මොහොතකහරි, කොතනකදී හරි, කවුරුහරි, මොන විදියකින්හරි,මොනම නීතියක් හෝ කඩ කරන්නේ නම් පිළිකුලෙන් යුතුව හෙලා දැකිය යුතුයි. ඊට පැහැදිලිවම විරුද්ධ විය යුතුමයි. ඒක සමාජ වගකීමක්.

ඉහතින් '**මොනම නීතියක් හෝ**' කියල සටහන්

කරපු නිසා වර්තමාන මිනිසා විසින් 'කැලෑ නීතිය' එපා කියල හදා ගත්ත නීති පද්ධතීන් ටික ලුහුඩින් හඳුනා ගන්න බලමු. ඒ අනුව පළමුවෙනි නීති පද්ධතිය තමයි '**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත**' නීතිය. ඒකට **මූලික නීතිය** කියලත් කියනව. මෙම නීතිය ජනතාව සතුයි කියල ප්‍රවාදයක් තිබුණත් අද එය ක්‍රියාත්මක වෙන්නේ ජනතාවගේ නියෝජිතයන් මගින් පමණයි. අළුතින් නීති පැනවීම, පැරණි නීති සංශෝධනය කිරීම, එය ක්‍රියාත්මක කිරීම, අළුත් අර්ථ නිරූපන ඇති කිරීම් ආදිය කරන්නේ බලධාරී නියෝජතයන් විසින්. සමාජය මකුළු දැලක් වගේය, නීතියත් ඒ මකුළු දැලේ නූලක්ය කියල මේ බලධාරීන්ගෙන් බොහෝ දෙනෙක් තාමත් දන්නෙ නෑ.

සාමාන්‍ය නීතිය හෙවත් **සිවිල් නීතිය** ඊළගට වැදගත්, රටේ සියළුම ජන කොටස්වල සකලවිධ සමාජ සබඳතාවයන් පවත්වා ගෙන යනු ලබන නීති රීති මාලාව මීට ඇතුළත් වෙනව. මේ සාමාන්‍ය නීති පැනවීමේ බලය පාලිතයන් විසින් පාලකයන්ට හෝ බලධාරී පාලකයෙකුට පවරලයි තියෙන්නෙ. ඒ නිසාම කියන්න පුළුවන් '**සාමාන්‍ය නීතිය පාලකයාගේ ආඥාවයි**' කියල.

මේ සාමාන්‍ය නීතිය කාටත් සමාන විදියට ක්‍රියාත්මක වුනු, බලවතාට එක විදියකටත්, දුබලයන්ට තව විදියකටත් කියන දෙපිටකාට්ටු වැඩ නැතිව සාමාන්‍ය මිනිසාටත්, සතා සිවුපාවාටත් සාධාරණ ලෙස යුක්තිය ඉටු වුනු වකවානු ඉතිහාසයේ ඈත යුගවලදී නම් තිබුණු බව පැහැදිලිවම පේන්නෙ අනුරාධපුර යුගයේ එළාර සමයේදීයි.

**ජාත්‍යන්තර නීතිය** මීළගට ඉතාමත් වැදගත්. අන්තර් ජාතික පිළිගැනීම්, සම්මුතීන්, සම්ප්‍රදායන්, ගිවිසුම් ආදී පුළුල් පරාසයක විහිදෙන නීති රීති මේ සඳහා අදාලයි. විශේෂයෙන්ම මානව හිමිකම් ගැන කථිකාවක් ගොඩ නැගෙන්නේ ජාත්‍යන්තර නීතියේ බලාධිකාරය බලවත් නිසයි. මෙහිදී නිරීක්ෂණයේ හා පරීක්ෂණයේ අවභාවිතාවන් සිදු විය හැකි වුවත් සදාචාරාත්මක ලොවක් සඳහා මේ නීති රීති ගරු කළ යුතුයි.

## චිත්‍රපට ගීතයකින්....?

70 දශකයේ දී රොබින් තම්පෝ අධ්‍යක්ෂණය කොට නිෂ්පාදනය කළ, කලාශූරී ලතා වල්පොල ගායනා කළ, ප්‍රවීන ගීත රචක කරුණාරත්න අබේසේකර කිවියාණන් පද රචනය කළ, ආර් මුත්තුසාමි සංගීතවේදියාණන් සංගීතවත් කළ ජනප්‍රිය වානිජමය චිත්‍ර පටයක් වන '**පික් පොකට්**' චිත්‍රපටයේ එන ගීතයකින් පවා මේ ගැන අපූරුවට කියවෙනව.


'ලෝක නීතිය යුක්ති ධර්මය
සත්‍ය භාවය බලය වේ
සුහද ජීවය සමගි තාවය
අමරණීයයි අගය වේ.

මිනිහෙකුගේ සරණක් සොයාලා
තවත් මිනිසෙකු ලතවෙලා
පලක් නැත අන් කෙනෙකුගේ
විශ්වාසයට නම් ගැතිවෙලා
තමන් සිරසට තමන් අතමය පිහිටවන
එක හිතවතා

නැති නිසා විශ්වාසයක් මිනිසා කෙරෙහි
මිනිසුන් තුළේ
දිවා රෑ දෙවියන් පුදාලා වැලඳ ගත්තේ
දෙවි බලේ
වඳින අදහන විටදි දෙවියන්
අපට සිතූ පැතූ දේ ලැබේ.

යහපත අගේ කරන, යහපත අපේක්ෂා කරන, යහපත් මිනිසා සමාජ යහපත උදෙසා පවතින නීතියක් රහසින්වත් කඩන්නෙ නෑ. ඇමෙරිකාවේ ප්‍රවාහන සේවාවක් හා මෝටර් රථ ධාවනය අනිකාට හිරිහැරයක් නොවන්නේ කුඩාම කුඩා සරළ නීතියක් පවා ඒ අය කඩ නොකරන නිසායි. නීති සුරකින විට, ඊට ගරුකරන විට, එය පිළිපදිනවිට, සමාජයට දැනෙන්නේ අප්‍රමාණ සැනසීමක්, අස්වැසිල්ලක්, සහනයක්. ඊත් ....... ?

## සමාජය ආපසු ගමනකට .... ?



ශක්තිය යුක්තිය කර ගත් කාලයක් මානව ඉතිහාසයේ ප්‍රාරම්භයේ තිබුණු බව සමාජ විද්‍යාඥයන්ගේ පෙන්වා දීමයි. කැලෑ නීතියට ඇහැක්, කණක්,නාසයක්, මනසක්, පරිකල්පනයක් නැහැ. තියෙන්නේ නියපොතුයි, දත් වහල්ලයි විතරයි. ඒ අනුව බලවතා දුබලයාව ගොදුරට ගන්නව, අදටත් සත්ව ලෝකයේ හැටි එහෙමයි. සත්තු අතර හිටපු එක සත්ව විශේෂයක් '**මනස උසස්**' කර ගත්ත නිසා කැලෑ නීතියෙ තියෙන ම්ලේච්ඡ කම අඳුනාගෙන 'සංස්කෘතික' සත්ත්වයෙක් වෙනව. එදා ඉඳල කැලෑ නීතිය වෙනුවට සමාජ නීතිය සම්මත කර ගන්නව. ඉන් පස්සෙ නීතිගරුක, සීලචාර, මානව

හිතවාදී සමාජ පරිසරයකට 'මනුස්සතා' හුරුවෙනව. සමාජානුයෝජනය වෙලා මිනිසා සංස්කෘතිකගත වෙනව. ඒ එක්කම තව තවත් පොදු නීති පද්ධතිය සකස් වෙමින් සමාජය පෙරටුගාමී ගමනක යෙදෙනව. අතීතය විසින් වර්තමානයට පාර පෙන්නුවෙ එහෙමයි.

ඊත් දැන් දැන් තත්ත්වය වෙනස් වෙමින් සමාජය ආපසු ගමනකට ප්‍රවේශ වෙනව. ඒ කියන්නේ කැලෑ නීතිය කලඑළි බහින බව දැනගන්නට පටන් අරගෙන. ප්‍රවර්තන සමාජයේ බොහෝ තැන් වලින් වගේම වගකිව යුතු තැන් වලිනුත් මේ බව ප්‍රකාශ කෙරෙනව. කෑගල්ලේ නූරිය ප්‍රදේශයේ වසර 10ක් පමණ වෙනමම ගොඩනගාගත් එක් පුද්ගලයෙකුගේ ප්‍රාදේශීය පාලනයක්වූ බව (ප්‍රභාකරන්ගේ උතුර මෙන්) ආසන්න හොඳම උදාහරණ රාශියකින් එකක්. "කොතරම් ධර්මිෂ්ඨ පාලකයෙකු යටතේ වුවත්, ඔහුගේ සිතිවිලි මත පැනවූ නීතිවලට අනුව ජීවත්වනවාට වඩා, හැම දෙනාම දන්නා හඳුනන, වෙනස් කිරීමට අපහසු නීති ක්‍රමයක් වඩා හොඳ බව "මධ්‍යස්ථ දේශපාලන විචාරකයන්ගේ අදහසයි.

නීතියට මිනිසා අවනතයි. මෙහිදී මිනිසා යනු, පොදු ජනතාවයි, පොදු ජනතාව සිය පරමාධිපත්‍ය බලය නියෝජිතයෙකුට හා ස්වාධිපතිට පවරනව. එයින් පස්සෙ ස්වාධිපති නීති පනවනව. නීතිය යනු ස්වාධිපතිගේ ආඥාව නිසා පොදුජනතාව ඊට අනුකූලයි. නොඑසේ වුවහොත් නීති කඩ කරන්නන් හට දඬුවම් ලැබෙනවා. '**ජනතාව විසින්, ජනතාව උදෙසා, ජනතා නියෝජිතයන් වෙත**'යි කියන ලෝ පතළ වාක්‍යයට අනුව නීති පැනවීමේ බලය එම නියෝජිතයන් සතුවෙනවා. මේ නියෝජිතයන් තම තම පැවැත්ම හා බලය වෙනුවෙන් පනවන නීති රීති, ආඥා හා සංශෝධන ගැන පොදු ජනතාව දන්නෙත් නැහැ. හැබැයි නියෝජිතයො කියන්නෙ ඒ අණ පනත්, සංශෝධන ඔක්කොම ජනතාව වෙනුවෙන්මයි කියල. මෙහෙම සිද්ධවෙන දේවල්වල යථාර්ථය දැන ගත්ත ශ්‍රේෂ්ඨ කාටූන් ශිල්පියො මේ හැමෝටම පොදුවෙ '**මගෝඩිස්තුමා**' (Knave) කියන සර්වනාමයක් යොදල තියෙන්නේ ඒකයි. මේ යෙදුම සමාජගත වුනේ 1978 න් පස්සෙදියි. පත්කරපු අය බලය භාවිතාකරන හැටි දැක්කම මේ පදය උන්නැහේලට හරියටම හරි. 1978 ට කලින් පැවති සමාජ ව්‍යුහය තුළ නීතිගරුක භාවය බොහෝ දුරට ආත්මගත වී තිබුණු බව ඉතිහාසය තුළ කියවෙනව. ප්‍රබල මැති ඇමතිවරු පමණක් නෙවෙයි අගමැතිවරු පවා ගරු අධිකරණයට කැඳවලා තියෙනවා. ඊත් ඉන්පස්සෙ යුක්තිය පසිඳලීමේ කාර්යයට සම්බන්ධ ආයතනික ක්‍රියාවලින් නිර්මල නැති බව පේනව. එවැනි අසීමිත සිද්ධි සමුදායක් අතරින් එක් සිද්ධියක් විතරක් මෙහෙම සටහන් කරනවා. එදාට විතරක් නෙමෙයි හැමදාටම ගැලපෙන මේ සිද්ධිය උපුටා ගන්නෙ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරයේ ප්‍රකාශනයකින්.

''1981 මහ රැපින පැමිණි අවස්ථාවේදී මහවැලි ගොවීන්ට ගොවිතැනට වතුර නොදී ඒවා නගරයේ ජල සම්පාදනයට හැරවීම නිසා ගොවීන්ගේ උපවාසයක් පැවැත්විණ. සමස්ත ලංකා ගොවි සම්මේලනයේ සංවිධායක ලේකම්වරයා මෙයට සහභාගිවීම ප්‍රදේශාධිපතියා උදහස් වීමට හේතු විය. පසු දිනෙක ලේකම්වරයා හිතවතෙකුගේ ගෙදරකට යනු බලා සිටි මැරවරයන් විසින් ඔහු බලෙන් පැහැරගෙන ගොස් පහර දී 'ගෙයක් බිඳිනට තැත් කළාය'යන චෝදනාව පිට පොලිස් අත් අඩංගුවේ තබා පසුව නඩු පවරන ලදී.

මේ සිද්ධියට මුහුණ පා සිටි අවස්ථාවේදී ඒ පිළිබඳව චෝදනාව ලැබූ තැනැත්තාගේ කට උත්තරයක් සටහන් කර ගැනීමට පොලිසියත්, නඩුකාරයාත්, වෛද්‍ය නිළදාරියාත් කැමති නොවූහ. ප්‍රදේශාධිපතියාගෙන් පැමිණිය හැකි ගැහැට වලට ඇති භිය නිසායි..."

- මානව හිමිකම් සහ ජන ජීවිතය - (8 පිටුව)

**S.G. පුංචිහේවා** -

සුදුසු ස්ථානයෙන් ඉවත් වුනාම දතුත්, කෙසුත්, ඇසුත්, ලිඟුවත් පිළිකුල් ඇතිකරවන බව විෂ්ණු ශර්මන් කියන' පඬිවරයා සඳහන් කරනවා.පසුගිය දිනක (2013/08/26) මහනුවර පොලිස් ක්‍රීඩාංගනයේදී, පොලිසියේ ඉහළ නිළයන්ගේ සංවිධානත්වයෙන් යුතුව බල්ලන් හා බැල්ලියන් ජෝඩු කීපයක් පෝරුව මස්තකයට තබා චාරිත්‍රානුකූල බලු විවාහ මංගල්‍යයක් පැවැත්වීමත් ලිඟුව අනවශ්‍ය තැනකින් තබා ප්‍රදර්ශනය කිරීමක් වගෙයි. වැඩ නැති බාබර් පාරෙ යන එළුවන්ගෙ රැවුල් බානවලු. තනතුරකට අදාල රාජකාරි ඉටු නොකෙරෙනකොටත් එහෙම හිතෙනවා. නීතිය බිඳ වැටුනමත් එහෙමයි.

නීතියට ගරු කළ යුත්තේ ඒක බිඳදැම්මොත් දඬුවම් ලැබෙන නිසාම නෙමෙයි. ඒ නීතිය මඟින් ජන සමාජයට සැලසෙන යහපත නිසා. ඒ වගේම යම් කිසි කෙනෙක් එක් තැනකදී (රහසින් හෝ) රටේ පිළිගත් නීතියක්

බිඳ දමල ලොකුවට ආඩම්බර වෙන්නත් පුළුවන්. ඊත් පසුව කොහේදී හෝ වෙනත් පරිසරයක දී කිසියම් අකටයුත්තක් තමන්ට සිදු වුනොත් එදාට එයා ඒ සඳහා යුක්තිය විසඳීමට නීතියේ පිළිසරණ පතන්න පෙළඹෙන්න පුළුවන්. එහෙම වුනොත් ඔහු ලැජ්ජා විය යුතුයි. මොකද ඔහුත් නීතියක් බිඳපු කෙනෙක් නිසා. සමාජයේ පොදු නීති රීති එකක්වත් උල්ලංඝනය කරන්න හොඳ නැහැ. ඒව තියෙන්නෙ සමාජයේ යහපතට. පිළිගත් නීති කැඩුවොත් සමාජයම කුණු වෙනව. සමාජයම ගඳ ගහනව. ජන ජීවිතය බිඳ වැටෙනවා.

**"රෝගයට හෝ සතුරාට හෝ තමන් කරා රිසිසේ එළඹෙන්නට ඉඩ හරින පුරුෂ තෙමේ සෙමින් සෙමින් මරණය ළඟා කර ගන්නේය".**

**- පංචතන්ත්‍රය - (257 පිට)**

කිසියම් සමාජයක නීති රීති උල්ලංඝනය කරල, නීතිය දූෂණය කළොත් ඒ සමාජය විනාශ වෙනව. නීතියේ සිදුරු හදාගත්තොත් විනාශය ලේසියෙන්ම ඇතුල් වෙනව. ලොකු නැවක් ගිල්වල දාන්න ඉදිකටු තුඩක සිදුරක් ඇතිලු.නීතිය නොතකා, නොසලකා හැරීම නිසා සමාජය පුරාම ලෙඩ රෝග වැඩිවෙලා. තහනම් විස රසායනික ද්‍රව්‍ය හා බෙහෙත් වර්ග ජලයට හා ශරීරයට එකතු කිරීම නිසා වකුගඩු රෝග, හෘද රෝග, ශාරීරික රෝග ඉහවහා ගිහින්. තහනම් කරල තියෙද්දිත් තාම බොහෝ ව්‍යාපාරිකයෝ ඒව විකුණනව.

## 5 වැනි කොසොල් හීනයෙන්.....?

ඉහතින් සඳහන් කළ විදියට **කැලෑ නීතිය** කියන්නෙ බලවතා සිය ශක්තිය යුක්තිය බවට හරවා ගැනීමටයි. තවත් විදියකට කියනව නම් නිතරම දුබලයා ප්‍රබලයාගේ ගොදුරක් වීමයි. ඝණ ගෝත්‍රික සමාජයේ එහෙම තිබුණ. මිනී මැරුම්, දූෂණ, අපරාධ, මංකොල්ලය, පහරදීම, පැහැර ගැනීම, වදහිංසා පැමිණවීම. වගේම සිය හිතවතුන්ට හා අනුගාමිකයින්ට පමණක් බහුවිධ වරප්‍රසාද හිමිකර දීම අවනීතියේ ශික්ෂාපදයි. 'තමාට සිදුවෙනු දැකීමට නොකැමැති කිසිවක් අනුන්ට නොකරව' කියල කොන්ෆියුසියස් තුමා පෙන්නල දුන්න කාරණය නීතිය වල් වැදුනු සමාජයට ගැලපෙන්නෙ නැහැ. එදා කොසොල් රජ්ජුරුවො දැකපු හීන 16 න් 5 වෙනි හීනයෙන් කියවෙන්නෙ නීතිය බිඳවැටුනු සමාජයක් ගැන. දෙදිසාවටම ඔළු දෙකක් හා කටවල් දෙකක් ඇති අශ්වයා දැකීමේ හීනයෙන් කියවෙන්නෙ කැලෑ නීතිය රජ කරන අඳමිටු රාජ්‍යපාලන සමයක් ගැනයි.

පින් පව් දෙකෙහි ඇදහීමක් නැති මෝඩ මිනිසුන් සිටින සභාවක ඉඳගෙන නඩු අසා විනිශ්චය කරමින් විත්තිකරුවන්ගෙනුත්, පැමිණිලි කරුවන්ගෙනුත් අල්ලස් ගන්නා නීතිඥයන් සිටිනු දැකිය හැකි බව බුදුන්වහන්සේ පැහැදිලි කළා. එමෙන්ම නීතිය රකින්නට ක්‍රියා කරන නීතියේ මුර දේවතාවන්ගෙනුත් වාර්තාවන අප්‍රසන්න සිද්ධීන් අකාලිකයි. අප්‍රමාණයි, මිනී පෙට්ටි උස්සාගෙන පොලිස් ස්ථාන ඉස්සරහට ඇවිත් උද්ඝෝෂණය කරන්නට තරම් පාලිතයන් හැඟිම්බර වෙන්නෙ ඒ නිසයි.

"පොලිස් නිළධරයෙකු ගැන සිතනවිට එක් එක් රටවල මැවෙන චිත්තරූප විවිධාකාරයි. නිව්යොර්ක් නුවරදී වහා කිපෙන සුළු බියකරු අයිරිෂ් ජාතිකයෙකු ලෙසද, පැරිස් නුවරදී සුළු නීති විශාල කර බලන, කථාවේදී වේගවත්ව අංග චලනය කරන කෙනෙකු ලෙසටද, ලන්ඩනයේදී ප්‍රසන්නභාවයෙන් යුත් සෙමින් වැඩ කරන, නොසැලෙන පුද්ගලයෙකු ලෙසට ද මැවී පෙනේ. මෙවැනි වෙනස්වීම් හේතු රහිතව සිදුවන දේවල් නොවේ. එවැනි ගතිගුණ උදාවී ඇත්තේ එක් එක් රටක පොලිසිය කුමන අන්දමකට පැවතිය යුතුද යන එම රටේ ඇති මතය අනුවය -"

**- ඇන්තනි මාර්ටින් -**

**(පොලිස් සඟරාව - 1974 මාර්තු)**

කැලෑ නීතියට කලඑළි නොබසින්නට කටයුතු සම්පාදනය කළ යුතු මෙරට පොලිස් සේවාව ගැන හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ සිරිල් සෙනෙවිරත්න මහතා විසින් කරන ලද ප්‍රකාශයක මෙහෙම තියෙනව.

"අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ට කුරිරු වදහිංසා පැමිණ වූ අවස්ථා ගැන පාර්ලිමේන්තුවේ ද කථාබහට ලක් විය. එහෙත් අහිංසක ජනයාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රජය කිසිම නිළධරයෙකුට දඬුවම් පැමිණ වූයේ නැත."

පොලිස් සේවාව කෙරෙහි අප්‍රසන්නභාවයක්, පොලිස් නිළධරයන් කෙරෙහි පිළිකුලක් දැක්වීමට ප්‍රධාන හේතුව වන්නේ මිනිසුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමය..."

**-මානව හිමිකම් හා ජන ජීවිතය- ( 43 පිටුව)**

සදාචාරය අගයන, යහපාලනයක් පතන, නීතිගරුක සමාජයකට අත් විඳින්නට වන යම් යම් අහම්බයන් නිසා සිදුවන අවභාවිතයන් ගැන සිහි කෙරෙන ප්‍රකට ගැමි පිරුළක් විදියට, 'වැටත් නියරත් ගොයම් කයි නම් - කාට පවසම් ඒ අමාරුව'කියල දක්වන්න පුළුවන්.

අවරගනයේ දේශපාලන මැදිහත්වීම් නිසා කිලිටි වී අශෝභන තත්වයට පත්විය හැකි 'ගෞරවණීය නීතිය' ආපස්සට ගමන් කොට වනගත වනු දැකීමට විධිමත් සමාජය අකමැතිය. ඉහළ ස්ථරයේ ඉඳල පහළ ප්‍රාදේශීය මට්ටම දක්වාම දේශපාලන පක්ෂ විසින් නම් කරනු ලබන නියෝජිතයන් තෝරා පත්කර ගැනීම් කරනව. එහිදී පිළිගත් දේශපාලන පක්ෂ වලින් අපේක්ෂකයො ඉදිරිපත් වුනාම නාමයෝජනා දෙනව. නාමයෝජනා දීමේදී........ කළු සල්ලි (Black money)ආකර්ශනීය සාධකයක් වෙලා එහෙට මෙහෙට සංසරණය වුනාට පස්සෙ සුදු පිරුවට ඇඳගෙන '**මගෝඩිස්තුමා**' කියන ප්‍රකට නම්බුනාමය දිනා ගන්නව. මේ නම්බුනාමයට හිමිකම උරුම ද කියන එක තීරණය කර ගන්නෙ එතුමා 'නීතිය' භාවිතා කරමින් සමාජයට කරන බලපෑම අනුවයි. කොහොම නමුත් '**සු**ප්‍රකට' වුනත් '**ක**ප්‍රකට' වුනත් 'ප්‍රකට' වුනත් මේ ඔක්කොම දෙවියන් වහන්සේ නිෂ්පාදනය කරපුව නෙමෙයි. ඔබේත් මගේත් සමාජ නිෂ්පාදනයන්.

ඛලීල් ජිබ්රාන්ගේ පහත සඳහන් සටහන තබමින් හමාර කිව හැකියි මෙහෙම.

"මිනිස් සමාජය බිහි වී මේ වන විට වසර ලක්ෂ ගණනක් ගතව ඇත. ඒ සා දිගු කාලාන්තරයක් මිනිස් සමාජය දූෂිත නීති මගින් යටපත් කර තිබීමේ අනිෂ්ට ප්‍රථිඵලයක් ලෙස නවීන මිනිසාට ස්වභාව ධර්මයේ සදාකාලික, උත්තරීතර නීතිය අවබෝධ කර ගැනීමේ හැකියාව මොට වී පවතී.

ඉටි පන්දම් ආලෝකයට හුරු වූ දෑසකට හිරු එළියේ ආලෝකය දෙස බැලිය හැකි නොවේ.

මිනිස්සු මේ ලෝකයේ දූෂිත සමාජ ක්‍රමයක් ගොඩ නගා ගෙන තිබේ. මෙයට හේතුව, මිනිසුන් පෙළනු ලබන අධ්‍යාත්මික ව්‍යාධිය එක් පරම්පරාවකින් ,ඊළඟට පැමිණෙන පරම්පරාවට දායාද කර දීමයි. මේ ව්‍යාධි තත්ත්වය දැන් ඔවුන්ට ව්‍යාධියක් ආකාරයෙන් නොපෙනේ. ඔවුන් එය හඟවන්නේ දෙවියන් වහන්සේ ආදම් වෙතට පිරිනමන ලද ධර්මයේ දායාදයක් විලසිනි.

මෙවැනි අන්ධකාර සමාජයකට එකී ව්‍යාධිය නොමැති නිරෝගී තැනැත්තා තේරුම් ගන්නට පවා පුළුවන්කමක් නැත. ඔවුහු එවැන්නෙකු අධමයෙකු පරිද්දෙන් දකින්නාහ්.

- බිඳුනු පියාපත් -(86 පිටුව )
- පරිවර්තනය ජනප්‍රිය ජයසිංහ -

රටේ බහුතර ජනතාව මේ ඛේදජනක තත්වය නුදුටු ඇස් ඇතිව, නෑසූ කන් ඇතිව, නොදැනෙන මනසිකින් යුතුව ගිනි කණා වැටී සිටිනව නම්, දහසකට අධික අපේ සංගමයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වන අප සැවොමවත් දැනුවත් වී සංවාදශීලි වී වෙනත් එක් අයෙකු බැගින්වත් ගොඩ දමමු. දැනුවත් කරමු.

ශ්‍රී ලංකාවේ ප්‍රබලම නීති සම්පාදන කෘතියේ පහත සඳහන් වගන්තිය කොයි කාගේත් විශේෂ අවධානයට යොමු කරනව.

**"සියළුම පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන වන අතර,නීතියෙන් සමාන ආරක්ෂාව ලැබීමට හිමිකම් ඇත්තෝය". - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 12(1) වගන්තිය.**



**අමරපාල කරසිංහ ආරච්චි.**
038 - 2234226

## මෑතදී අපෙන් සමුගත්තෝ

වෘතතීය වශයෙන් එකමත් එක දවසක දී එකට හමුවුනා, රාජකාරී වශයෙන් එකට ගොනුවුනා. සංස්කෘතික වශයෙන් අත්වැල් අල්ල ගත්තා. සිනාවට හවුල් උනා. කඳුල හා සුසුම බෙදා ගත්තා. ශාරීරික වශයෙන් කල්පිරුනම ඉසිබුව ගත්තා. ඉන් පස්සෙ ඉසිබුව ලැබුවන් අතරෙ සාංගමිකව අත්වැල් බැඳ ගත්තා. එත් ඉසිබුව ලැබූ සමහර හිත මිතුරන් මේ ගොනුව තුළට නොපැමිණෙන එක ගැනත් විස්සෝප වුනා. මොනව කරන්න ද ? තම තමන්ගේ මනාපෙ නේ කියල හිතහදාගත්ත. මේ විදියට වෘත්තිය වශයෙන් එදා මෙදාතුර වූ සියළු දයාබර මතකයන්ට නැවතීමේ ලකුණ තියා සමහරු යන්නම යන්න ගියා. මෑතකදී එහෙම අපේ මතකයට නොගෙවෙන සුවඳක් එකතුකළ සදාදරණීයයන් කිහිපයක් මෙහෙමයි.

**ජෝසපින් විතානගේ මහත්මිය (3109), වී. කනකලිංගම් මහතා (536), පී.එම්. සේනාරත්න මහතා (1052), ඒ.යූ. කන්නන්ගර මහතා (1276), ඩී.ආර්.පී. කන්නන්ගර මහතා (3449), එච්.එම්. සරත් ජිනදාස මහතා (3139).**

මේ හැමට අපගේ උත්තමාචාරය !

# Death Donation Schemes for Pensioners

Many social organizations provide assistance to their members under relief schemes.These financial assistance given as donations on the occasion of death of members, is of much importance. Extent of the donation for each organization, differs from each other according to the strength of the membership. These donations are given to the closest relation of the deceased conducting the funeral.

Following abbreviations appear in the pension advice of the Central Bank, refer to Death Donation schemes in function:

• **CBSL–DDF – Central Bank of Sri Lanka Death Donation Fund** is operated by the Central Bank members or employees who have joined the Fund voluntarily. On each occasion of death of a member, a sum of Rs.25 is recovered from each and every member and donated to the person nominated by the deceased. Membership of this Fund was 1480 in April 2013.

• **CBSL–DRF – Central Bank of Sri Lanka Death Relief Fund** is also operated by the Central Bank. Membership fee recovered from each member is Rs.50 per month. This fund donates Rs.25,000/- on the occasion of death of a member and Rs.12,500/- on the occasion of death of a registered dependent.

• **CBEU–DDF – Central Bank Employees Union – Death Donation Fund** is operated as named by the Central Bank Employees Union. In the occasion of the death of a member, a sum of Rs.30 is recovered from each member and donated to the nominee of the deceased.At present, the membership of the Union is around 1000.

• **VRS-DRF –Voluntary Retirement Scheme – Death Relief Fund** is operated by the voluntary retired officers' Union. A monthly membership fee of Rs.50/- is recovered from each member. At present, there are 220 members in this Union. From this fund, a sum of Rs.15,000/- is paid to the nominee of the deceased. However, every member can get a sum of Rs.5,000 on the occasion of death of a dependent and thereafter only the balance sum of Rs. 10,000 is paid on the occasion of death of the relevant member.

• **Central Bank Pensioners' Association– Death Donation Scheme -** This is the Death Donation Scheme operated by the Pensioners Association. Any member of the Association can seek the membership of this scheme. At present, there are about 200 members in the Scheme. In the occasion of death of a member a sum of Rs.30 is recovered from each member and donated to the nominee of the deceased. If many pensioners join this scheme, it will be more beneficial to them and all.

• **CBSLPA** – This abbreviation refers to the **Central Bank of Sri Lanka Pensioners Association**. The membership of the association is offered to all retired employees of the Bank. In the occasion of the death of a member, a sum of Rs.25,000 will be paid. Their donation does not involve any additional payment to members, but it is maintained with the membership fees recovered monthly from all members.

**Translated by - Siri Fernando**

# ජ්‍යෙෂ්ඨයි-විශ්‍රාමිකයි
# මහ බැංකුවයි-වාර්තාගතයි

ශ්‍රී ලංකාවෙන් බ්‍රිතාන්‍ය ජාතිකයන් **"නිදහස්"** වීමෙන් පස්සෙ රටට ඔබින මූල්‍ය පාලනයක් හා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙනයාමේ අවශ්‍යතාව පැනනැගුනා. පවුම්, සිලිම්, පැන්ස වෙනුවට රටේ අනන්‍යතාව තහවුරු කෙරෙන මුදල් ඒකකයක් හඳුන්වා දීමට කල්පනා කළා. **වෙස්ට් මිනිස්ටර්** දේශපාලන විධික්‍රමයේ ළදරුවන් වන එවකට හිටිය පාලක පංතිය විධිමත් මෙන්ම ශාස්ත්‍රීය ක්‍රමයක් වශයෙන් මහ බැංකු ක්‍රමයට අවතීර්ණ වෙනව. රුපියල ඔටුනු පළඳිනව. නව මූල්‍ය අධිකාරයට නායකත්වය දීම සඳහා සුදුසු විශේෂඥයෙක් එංගලන්තයෙන්ම ගෙන්වා ගැනීමට එවකට ගරු මුදල් ඇමතිතුමා වූ **ජේ.ආර්. ජයවර්ධන මහතා** කටයුතු කළා. ඒ අනුව **ශ්‍රීමත් ජෝන් එක්ස්ටර් මහතා** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රථම අධිපතිධුරයට පත්වෙනව. ඒ 1950 අගෝස්තු 28 දා ඉඳලයි.



*එවකට අගමැති හා මුදල් ඇමති*

එදා පටන් මූල්‍ය අධිකාරියේ කටයුතු හෙවත් දේශීය ආර්ථික වර්ධනය, සංවර්ධනය හා තිරසාර ආර්ථික සංවර්ධනය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාව පැන නැගුනා. වගකීම් වැඩිවීමත්, කාර්ය බහුලවීමත්, මූල්‍ය පරිපාලන විධික්‍රමයන්හි ප්‍රසාරණයත් නිසා එවකට විවිධ ශ්‍රේණීන් සඳහා උගත්,



***ශ්‍රීමත් ජෝන් එක්ස්ටර්***

බුද්ධිමත්, දක්ෂ, ක්‍රියාශීලී, විනයගරුක මහත්ම මහත්මීන් බඳවා ගත්තා. මේ බඳවා ගැනීම සඳහා අද කාලේ වගේ එවකට දේශපාලන බලාධිකාරයේ ඇඟිලි ගැසීම් තිබුනෙම නෑ. (ඒවා වෙනස් වෙන්නෙ පසුකාලීනවයි) ඒ කාලෙ මහ බැංකුවට බැඳුනු අය අද කොහෙද ? කවුරුත් නැතුව ඇති කියල බොහෝදෙනෙක් කියාවි. ඒ වුනාට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයෙක් හැටියට හිටපු ජ්‍යෙෂ්ඨම පුරවැසියෙක් ගැන කියන්නයි ඉහත සඳහන් පූර්විකාව ලිව්වේ.

ඔහුට ජපනුන් කොළඹට දැමු බෝම්බවල සද්දෙ ඇහුනා. ආනන්ද සමරකෝන් ශ්‍රීමතාණන්ගේ 'නමෝ නමෝ මාතා' කියන ප්‍රථම ජාතික ගීයත් ඇහුන. ඩී.එස්. සේනානායක ප්‍රථම අග්‍රාමාත්‍යතුමාගෙ රාජාසන කථාවත් ඔහුට ඇහුනා. පසු කාලෙක රටම ඇවිලී ගිය 1953 හර්තාලය හෙවත් ජනතා විරෝධතාවත් දැක්කා. ඒ වගේම ශ්‍රී ලංකා මහබැංකුවේ ප්‍රථම අධිපති ශ්‍රීමත් ජෝන් එක්ස්ටර් මැතිඳුන්වත් දැක්ක.

ඔහු මහ බැංකු කාර්ය මණ්ඩලයට එකතු වුනේ 1952 දෙසැ 01 දායි. ඒ කාර්යාල කාර්ය සහායකයෙක් හැටියටයි. හැබැයි ඒ පත්වීම අහම්බයක් මිස, නීතිවිරෝධී දේශපාලන තල්ලුවක් නෙමෙයිලු. ඔහු හික්කඩුව පිරිමි පාසැලෙන් සිංහල 8 කැළෑසිය සමත්ව හික්කඩුවේ හිටිය ප්‍රකට පඬිරුවන්ගේ ඇසුර නිසා ඉංග්‍රිසි භාෂාවත් තොල ගෑවා. ඒ කාලෙ අද කාලෙ වගේ නෙමෙයි. පහළ ශ්‍රේණියෙ සේවකයන් ඉහළ ශ්‍රේණිවලට ගෞරව සම්ප්‍රයුක්ත සැලකිල්ලක් තිබුන. ඒ නිසා ඔහු බොහෝ දෙනාගෙ ලෙන්ගතුකමටත් භාජනය වුනා. කොහොම නමුත් අවුරුදු 18 යි මාස 2 ක පමණ සේවාකාලයක් සම්පූර්ණ කරමින් ඔහු 1971 පෙබ. 22 වැනි දින විශ්‍රාම ගියා. ඒ කාලෙ අද කාලෙ වගේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ කාර්යයන් විධිමත් නොවුනත් අවිධිමත් නෑ. ඔහු වෙනුවෙන් මහ බැංකුවෙ සටහන්වන විශ්‍රාම වැටුප් අංකය 30 හැටියටයි මාසික වැටුප් නිවේදනයේ සඳහන් වෙන්නෙ. ඔහුට ළමයි සිව්දෙනෙක් හිටියත් දැන් ඔහුව බලා කියා ගන්නෙ ලොකු දුව. ඒ දුවගෙ වයසත් අවුරුදු 70 ක්. එයා තමයි මේ විස්තර ටික කිව්වෙ. ඇය පවසන ලෙසට **ඔහුගේ මූලික වැටුප අදට සාපේක්ෂව බලන කොට ඉතාම කුඩා සංඛ්‍යාවක්.**

පසුගිය දිනෙක කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් ඔහුගේ සුවදුක් විමසීම සඳහා බැංකු නියෝජිතයන් කිහිප දෙනෙක් පැමිණීම ඔවුන්ට ඉමහත් සතුටක් ගෙන දෙන කාරණයක් වෙලා.

වර්ෂ 1911 පෙබ. 22 දින උපන් මොහු දැනට ඉන්නෙ ඇඳේ. හරිනම් ඇඳට වෙලා ඉන්න **මොහු ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉතිහාසගත වාර්තාවක්.** එදා මෙදාතුර ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයේ ආසන්න යේම සිට මේ දක්වා සිටින වයස්ගතම මහ බැංකු සේවකයායි. **දැනට ඔහුගේ වයස අවුරුදු 102 යි මාස 6 කුත් ඉක්මවා ගිහිල්ලා. වාසනාවන් !.**



පසුගිය වසර වන විට තමාගේ යම් යම් කටයුතු තමන් විසින්ම කරගත් බවත් සටහන් කරන්නේ අතිශය ගෞරවයෙන් හා සතුටින්. ඔහු හික්කඩුව, හෙට්ටිගොඩ, ශ්‍රී සුමංගල පාරේ, අංක 47/2, නිවසේ පදිංචි හෙට්ටිආරච්චි එලියට් ගුණවර්ධන හෙවත් එලියට් රාළහාමියි. හැබැයි අප සංගමයේ සමාජිකයෙකු නොවුනත් එතුමාට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයන්ගේ සංගමයේ ගෞරවණීය ප්‍රණාමය පිදෙන වගයි!. චිරං ජයතු !.

**- සංස්කාරක -**

Tamil poem for this volume were selected from the Book "Hiruth Hima Piyallaka" by author Mr. Mahinda Prasad Masimbulla, purely due to the Reason of Non-Presentation of such Tamil Articles by members.

## ஓர் மடல்



*நெலும் கவி, லீ கெளி, ஒலிந்த கெளி
இங்கும் இல்லாமலில்லை அம்மா
ஆனாலும் அவற்றை மாற்றி மாற்றி
புதிது புதிதாய்ச் செய்கிறார்கள்

விழாக்களும் இப்பொழுது அதிகமென்பதால்
காட்சிகள் தொடர்ந்தபடி உள்ளன
உறக்கமேயில்லாமல் இரவு முழுதும் ஆடுகிறேன்
காலையில் ஒத்திகைக்கு ஓடுகிறேன்

உடலழகு தொலைந்துவிடுமென்று
இரவுணவையும் தருகிறார்களில்லை
இளம்பெண்கள் பத்துப் பேர் நாம்
அவர்களறியாமல் தேநீர் தயாரித்துக் கொள்கிறோம்

பாடல் ஒளிப்பதிவுகளுக்குப் போனால்
ஆயிரம் ரூபாயளவில் கிடைக்கும்
மேலதிகமாக ஆனாலும்
மூட்டுக்களிலும் முதுகெலும்பிலும் வலியெடுக்கும்

புதிய நடனமொன்றின் மெல்லிய ஆடையில்
கவரப்பட்ட செல்வந்தனொருவன்
பரிசுகள் தந்திட அழைக்கிறான்
நான் முடியாதென்றே மறுத்து வருகிறேன்

விழா நாட்களில் எனக்கு எனது
அம்மா சொன்னவை நினைவில் எழுகின்றன
உண்மைதான் சில விழிகளில்
பெரும் அறியத்தைக் காண்கிறேன்


ஒன்பது நாடகங்களுக்குக் காட்சிகள் தொடர்ந்திருக்க
நேற்றென்னை அந்த வருத்தம் பிடித்தது
ஆனாலும் அதனைக் கவனத்தில் கொள்ளாமல்
வீட்டைப் பற்றி எண்ணி எண்ணியே ஆடினேன்

அம்மாவின் மருந்துகளையும்
அப்பாவின் திதிக்கான பொருட்களையும்
வாங்கத் தேவையான பணத்தை இதோ அம்மா
இந்தக் கடிதத்துடனேயே அனுப்பியிருக்கிறேன்

சகித்திட இயலாக் கைதட்டல் விசிலோசைகளினிடையே
தொலைவில் தெரியும் பின்மூலையில்
கண் இமைத்திடாது எனையே பார்த்தவாறு
அம்மா இருப்பது எனக்குத் தெரிகிறது

*நெலும் கவி, லீ கெளி, ஒலிந்த கெளி - கிராமிய ஆடல், பாடல்வகைகள்

**தமிழில் - எம்.ரிஷான் ஷெரீப், இலங்கை**





Points to Ponder

# LIVE AND LET'S LIVE




Words are little containers. They can ,mean, either good or bad. With hate or love. Genuine or false can mean in matters of life. positively or negatively, venomous if not meant sentimentally with appease. Damaging the spirit instantly loosing its geniality.

One must know, on the other hand, its a universally accepted fact, actions speaks faster than words. Utterances of any sort, without caution, can linger through the day, may be even for a whole life time. Hurtful, more serious they can be, to those who are compelled to hear, due to circumstances. Very unfortunate,as there repercussions, with big or small, can be alarmingly dangerous, and irresistible. So, the saying goes, " a stitch in time saves nine". Creating things pleasant to live, makes all live, in harmony and unitedly.

A glaring, confirmation of this fact, is one's own families, and homes. Healthy, and fascinating atmospheres, and environments conducive, to one and all, are doomed forever, by outside pollutions. Regrettably, painful and shameful, as it is more than cruelty to animals. Is there any justification, by our calling ourselves humans. ? What do we really mean , by social justice? Utterly ridiculous, thinking of togetherness, which is the key, to oneness. Aren't these actions, of so called human, deplorable ?

**F.R. IRUGALBANDARA**

---

Points to Ponder

# NATURE'S BEAUTY NOT A FALLACY




1. Nature is an eye opener, in all forms, it glamour irresistibly.
Mother Nature provides all splendour of creation for existency.
Facinating and prodigious in its' amazing beauty.
Admiring the natural forms is a blessing given inceptionally.

2. happiness and contentment are hidden secrets in life for us to discover.
Allow not these marvellous wonders escape without admiration to capture.
Comparison is not essential all seems majestic in natural formations of nature.
Nature's bearings and holdings are a wonder, humans cannot render.

3. Beauty produces everything in its glorious forms with unbelieveable splendour
Trees, plants, herbs,along with Sun ,Moon,stars upon the blue sky showing its glamour.
Mountains, Valleys, lakes and streams with waterfalls gushing along endlessly sounding like thunder. Enormous are they,their benefits,gifting us a Paradise, for ever to yonder.



**Francis . R. Irugalbandara - 141**

පැදි විදි

# සෙනහසක ඉඩෝරය



1) කන්ද මුදුනින් බැස්ස කොමලිගෙ සේද පටපිලි වියැළුණා
ලන්ද පිනවූ සියොත් රාවය ගොළුව නුබගැබ වැලපුණා
අන්ද මන්දවු විහග පොදි රැස අඹර දස අත ඉගිලුණා
චන්ඩ මාරුත හමාගෙන විත් මලින් පිරිවැල් විසුරුණා

2) නිවී නිවී දිලි ටිකිරි තරුකැට වලා මැද්දේ සැගවුණා
මැවි මැවී නෙත් ඔකඳ කරලූ දෙබැම දේදුනු නොපෙණුනා
පෙවි පෙවී රස නහර පිනවූ දෙතොල් නාදලු මැලවුණා
දැවි දැවී හද ඉරිතලා ගිය ඉඩෝරයකට මැදිවුණා

3) සිහිල් දිය කඳ පිටාරව ගිය වැවේ පතුලත මතුවෙලා
සවන් පිනවූ අමා දෙන සේ යදී සුසුමන් ගොළුවෙලා
දර ඉපල් මෙනි ලොවම මැළවී නියං රකුසට බිලිවෙලා
සෙනේ වදනින් සොඳුරු බැල්මෙන් තොරවු හදවත ඉරිතලා

4) වෙලාගෙන හද පාලු උයනක මාලතී මල සුවඳ උරමින්
මුලා විය මිරිඟුවක ලොබ බැඳ පවස නිවනට ඈත දුවමින්
ගලාගෙන ගිය ගඟක් තිබුණා මුහුදු හිමිවෙත ගියා බැතියෙන්
බලාගත් වන බලාගෙන හිඳ රහස් මුමුනයි සමග සුළගින්

සඳුන් විජේසිරි
නුගේගොඩ

# අපායේ සතියක් හෙවත් මනස්ගාත

අළුයම ඇසෙන වෙලාවේ පොල් කිචි ගිත.
නොතකා සැරට එන දැඩි සුළගඳ සිත.
නොසිටිය නිසා අඳුනන්නෙකු ළඟ පාත.
බැස්සෙමි අපායට ගවු ගණනක් පාත.

දොරටුව අසලින්ම එහි ඇති මුර කුටියේ
තැන කිසිවෙකුත් සේවයෙ එදවස සිටියේ
වැසිලා තිබුණු දොර තදටම කිටි කිටියේ
ඇරුනා ඉබේටම මා එහි ගිය සැටියේ

යමයෙක් ඇවිත් අල්ලා මගෙ අත තදට
යා යුතු බව කීය මා යම රජු ළඟට
බය වී හොඳටෝම පණ නැති වී ගතට
ගොත වී වචන නැත ආවේ මගෙ මුවට

නැතිවම පණ ගැටෙමින් පා එකි නෙකට
දහඩිය වලින් තෙත්වී පිළි මගෙ ගතට
'සට සට'ගගා ගැහෙමින් අත කට නිකට
හෙම්හිට ගෑටුවෙමි මම යම රජු ලගට

පෙරළා බලා පවු පොත පිටු එකි නෙකට
හෙලුවා දෑස මගෙ දෙපයේ සිට හිසට
සොඳුරු සිනහවක් නගමින් යම මුවට
නැති බව කීය පවු වැඩිපුර මගෙ නමට

"පවු කරමින් සිටින මනු ලොව එවුන් හට
තැනුවෙමි අපායක් තව ගවු හතක් යට
මෙය නරකය නොවන බව පවසමි ඔබට
දුක් විඳ පෙරලුවෙමි මෙය දෙව්ලොව බවට

"සුර සැප නොවිඳිති මගෙ මැති ඇමති වරූ
දුක සැප දෙකම සම වී ඇත උන්ට හුරූ
මගෙ නිලරිය බලව හැම සැපතින්ම වැරූ
බේබි ඔස්ටින්ය රිය අසු වියද පිරූ

"ඇවැසි වුනා මෙහි තම වෙනස් කෙරුමට
යැවුවෙමි අයැදුමක් ලඟ ඇති ඔබෙ රටට
දොලොස් මසක් ගතවුනෙමුත් අද දිනට
තවනැත පිළිතුරක් ලැබුණේ අපෙ නමට

"නැත මගෙ ඥාති හිත මිතුරන් පෝෂණය
නැති කෙරුවෙමි මෙහේ අල්ලස දූෂණය
අසන්නටපවා නැත මෙහි හිෂණය"
ඇසුවෙමි මෙසේ යම රජුගේ දේසනය

ලදිමි අවසරය සතියක් විසිමට
කුසගිනි දැනුනි මට කිව නොහැකි තරමට
අඟනක් රුවැති ගෙන මගෙ අත සිනිඳුවට
මා කැන්දන් ගියා භෝජන හල තුළට

" එව කව බොව " කියන හඬ එම සැලෙන් ඇසේ
නානා මිහිරි භෝජන සැම තැනම පිසේ
කෑවෙමි බඩ පුරා ඉන්පෙර නොකෑ ලෙසේ
එහි ඇතිරසගුණය මම පවසම්ද කෙසේ ?

අඟනක් රුවැති ගෙන මගෙ අත සුමුදුවට
මා කැන්දන් ගියේ ලඟ රඟහල තුලට
සිටියෙමි බලා බරව් සැප අසුනකට
මා පමණකි සිටියෙ ආ ගිය මිනිහෙකුට

පාට පාට එළි නලියයි අඳුර කපා
සියොළඟ නටවමින් සුලලිත මුකුළු පපා
වයන පදට තබමින් සළඹ බැඳි දෙපා
දුටුවෙමි මම රඟන සැටි ඒ ළඳුන් අපා

කල් ගෙවමින් මෙලෙසින් දින හතක් පුරා
විසිතුරු දසුන් බලමින් එහිම සැරි සරා
අපා ලදුන් සිව් දෙනෙකු ද සපිරි වරා
ආ වෙමි සන්තොසින් යළි යම රජිඳු කරා

යම රජු සලා හිස පලකරමින් සතුට
"ජයවේවා" කීහ ඉත සිතින් මා හට
තිබුණත් සිත සතියක් තව එහි ඉන්ට
පිං මදි නිසා ආවෙමි යළි මනු ලොවට

මෙය කියවන ඔබට
හැකි නම් සිනහ වීමට
නොකරනු එසේ මට
සිනහවෙනු හැකි තරම් නිරයට




පී. ඩී. අබේපාල.
011 2268849.


---


පැදි විදි

(නිමිත්ත ) :-

" ............විශ්‍රාමික ප්‍රතිලාභයන් වෙනස් කිරීම, වෙනස්වන ආර්ථිකයට අනුගතවන ලෙස මානව සම්පතෙහි කුසලතාවයන් අඛණ්ඩව වර්ධනය කර ගැනීමට කටයුතු යෙදීම, වයස් අනුව සිදුවන **"වෙනස්ව සැලකීම"** අවම කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හා සංස්කෘතික වෙනස්කම් සැලසීම ආදී සුදුසු ප්‍රතිපත්තීන් යොදා ගත යුතු වේ . "

- වාර්ෂික වාර්තාව 2012 -( 113 පිට )

## උල්පතේ ඉසිබුව



1) එක පොකුරේ එකට පිපිලා ලෙල දුන්නේ
සැර වැර නෝක්කඩු නැහැ දිගු කල් පැන්නේ
දැනුමට තර්ක වාදෙටමයි ඉඩ දෙන්නේ
එහෙමයි ඥාන ගුණට රස උල්පත දුන්නේ

2) කොඩි ගහ උඩින් දින අධිපති වඩින් නේ
මුව දොර තණ තිල්ල 'මෝනිං' කියන් නේ
හෝරා **'වැතම්'** චක්කරයෙන් වදින් නේ
යුතුකම් වගකීම් උල්පත උනු'නුන් නේ

3) කටට බඩට නැව් දියඹෙන් වඩින් නේ
මෙහෙන් නැවට සොච්චම් බර නැගෙන් නේ
ගෙවුම් හිඟය නැත තුළනය කෙරෙන් නේ
උල්පත සිඳින්නට නැත ඉඩකඩ දුන් නේ

4) කාසිය සවිමත්ව තිරසර කර ගත්තේ
මල්ලක් පිරෙන්නට සිනහව අර ගත්තේ
රටකින් පැතුම් පොදි එවිටයි එල ගත්තේ
උල්පත් සවිය අද මෙහි ඉසිබුව මත්තේ

5) කඳුළට උල්පතයි මව්පිය දුරුවේ නම්
සුසුමට උල්පතයි බැඳි පෙම නැතිවේ නම්
තැවුලට උල්පතයි සව්බල පිරිහේ නම්
තනියට උල්පතයි නොතකා හැරියේ නම්

6) ඉන්නේ පෙර පරිදි නොව ලොව පරකා සේ
කන්නේ ලෝක මානෙට ඇති අවකා සේ
බොන්නේ දෙනෙත් දිය **'මීටර'** නැත දෑ සේ
එන්නේ කවදාද සහසැස් හැර දෝ සේ




යසනායක සිරිවර්ධන
011 2843902
071 4433208

# HAPPINESS

Life as we know is a continuous activity. In normal life the driving force for this activity is from feelings and emotions, such as fear, anger, kindness, love, jealousy, etc. Each emotion impels man and animal into action to engage in the particular activity or behavior for which the emotion is there. But the two opposite and most dominant feelings that set in motion the great activity we call life are sorrow and happiness.

It is worthwhile having a glimpse of the way sorrow and happiness operate on animal activities to make them live. Out of the two feelings sorrow or suffering is like the cane of the carter. It is to inflict pain as punishment on the living being when it fails to find and utilize the needs of life. One may say the loss of our dear ones or precious articles also causes sorrow. But dear ones and precious articles are needs of life. The happy feeling is there to please and gratify the living one for properly engaging in an activity of life. But the joyful and happy feeling given is necessarily made temporary for the living being to move from one activity to another.

The feeling of happiness is of many forms such as joy, pleasure, mirth, rapture, bliss, ecstasy, etc. felt in diverse activities and conditions. They also vary in intensity and duration. Out of these forms, bliss and more so ecstasy are intensely happy states seemingly reserved for the higher and virtuous minds. The other kinds of happiness are to please or thrill the common lot of humans and animals. Although happiness in all forms pleases, there is a mild but lingering type of it which is more preferable for us humans.

Compared to other animals, in spite of man's far superior intelligence, he too is under the influence of sorrow and happiness. In fact we seem to feel the two emotions more sharply that one could say, happiness is the man's greatest pursuit. He even wants it to be eternal. Many are his faiths and beliefs in expectation of never ending happiness seeming to undermine the concept of eternity. A down to earth approach to receive and retain a fair form of worldly happiness is more desirable.

The first requirement for a happy life on earth is economic and social security. With resources, abilities and gifts available to each of us, one should strive to live a comfortable life economically without exerting the efforts to undue limits. As man is a social animal he needs company for a fuller life. So with tact and patience one should try and make his or her neighborhood favorable and friendly or at least un-interfering.

A policy of live and let live will enable to further our socialness and cultivate moral sentiments so inviting to happiness. The policy ardently preached by the great thinker Confucius of ancient China is ever green and useful. It encourages to respect the life in all others and to bestow unto them feelings of sympathy and kindness, with a mind to help their living. The true followers of the policy can reap the benefit of joyful feelings as a gift from nature the mother unto all living.

Another means to invite happiness into our lives is by keeping an un-intrusive personal pursuit or hobby in one's life. Engagement and advancement in a line suited to the natural taste, abilities and gifts of a person is a long lasting source of pleasure and joy. Such individual pursuits and hobbies in arts, sciences, handicrafts, sports, social services etc., seem to adhere and stay with individuals and from life to life of persons progressively acquiring talents. However too much is bad and over indulgence in such an activity is detrimental to happiness.

What were mentioned above are some suggestions to be in possession of the much desired happiness in our lives. Although the joyful feeling has many shades differing in strength and duration, the more desirable form of joy is the fairly long lasting, soul soothing, happiness mild in nature. A reward it seems unto those living in harmony with nature, somewhat leisure loving contended in mind and not much after wealth, fame or power.



**W.D.A. Raymond - 0112 231357**

# FOR THE GOOD TIMES




Wishes and promises Keep pouring expecting a better life
Partying whining and dining combined with a good wife

These may be dreams with fuel and power hikes
Sans halal and fags spirits and such likes.

The economy they say will never decay through others keep falling flat'
How can we fall either way while we are on a mat ?

Its the best of times for those on line yet the worst of times
for those who toil.

**T. Wickremasinghe**
**(thw191@gmail.com)**

පැදි විදි

# කැදැල්ල පාළුය




ලෝකය එකම යායක් බව සනිටු කර
සිල්ප උගෙන අගතැන්ගෙන ලැබ අදර
තව තව ඉහළ යන්නට දුරලා අඳුර
දුර රට ගිහින් දරුවන් අප දා ගෙදර

ගිය ගිය තැන ලබා ජය පියවර නගමින්
යස ඉසුරේ ගිලී කල් ගෙවුවත් යහතින්
දෑසට නොදැක කුමටද ? උණුසුම අතරින්
වාවනු නොහැක නුඹ ගව් ගානක් ඈතින්

රජ සැප විඳින බව කීවත් පා පෙම්මා
නිදි නෑ නෙතට දිව - රෑ දුක නැත නිම්මා
තතු නොලැබුණු විටදී උණු කඳුළෙන් තෙම්මා
නුඹ සක්විති වුවත් - **"තවමත් මං අම්මා"**

පාළු ගෙදර තනිවී සිටිනා කලට
සුරතල් සිනාහඬ සිහිනෙන් ඒය ගෙට
සයුර ගැඹුරු වෙයි දියඹට යන කලට
දරු සෙනෙහසද වැඩි දුර - දුර යන කලට



කවා,පොවා, නාවා, දෝතට රැගෙන
නිදි නැති රෑ පුරා තුරුලේ හොවාගෙන
"රතු ලේ කිරට හරවා" කුස පුරවමින
තැනු දූ දරුන් අද රට හැරදා ගොසින

දවසක් ගෙවී දවසක් අලුතින් එද්දී
වියපත් දෑස අවදිව මග බලා හිඳී
"අම්මේ" කියන හඬ ලය තුළ එයි පිබිදී
හෙට දවසෙවත් ගෙට ඒ දැයි බලා හිඳී

අතැඟිලි බැඳන් උදයට පාසැල පැත්තේ
ගිය හැටි සිහිවේය තවමත් දුවේ පුතේ
දෙවනත් කර ගෙදර - ලෙස හැම එක ඉත්තේ
ගෙවි කාලය සදා නො හැසී සිත ඈත්තේ

සුදු රැලි ගවුම්, මිරිවැඩි, බෝනික්කන් නේ
නටබුන් ගෙයි පුරා තැන තැන මතුවන් නේ
"කුරුළු කූඩුවක" උණුසුම සිහිවෙන් නේ
පියඹා ගොසින් පැටවුන් ලොව තැනින් තැනේ



ප්‍රේමා චන්ද්‍රසේන
(දු.ක. 011-2963518)

## How Old....!

**A** personal manager was interviewing an applicant for a job with his company .

" How long did you work in your previous position ? "

" Fifty Five years ...... ! " replied the applicant.

" And - how old are you ..... ? asked the manager, clearly shocked at the applicant's answer.

" I am 47," said the applicant

" I am sorry ! " replied the manager.

" I don't understand "

" It's simple, " smiled the applicant.

" With - overtime .....! "

( From : Reader's Digest " )
**Gamini Chandrasena**

---

## Discarded

Points to Ponder

Unscalable walls
Thorny pikes
Protect the 'Rest" from the wretched lot
They are prisoners
What hideous crimes have they committed ?
amongst the so called saints they lived
Till ' Rest' deemed seclusion
Perhaps a man can grin or laugh
May have reasons of his own
To revel in his thoughts
Explore new horizons on his own
None can say he is insane
Who measureth sanity and insanity ?

**by : B.L.K. Perera**
**Phone: 011 - 2911481**




## " Yes ..... I are ......!"

විදේශීය සංචාරකයන් බහුල වශයෙන් ගැවසෙන හික්කඩුව ප්‍රදේශයේ ග්‍රාමීය උපතැපැල් පාලක ස්ථානාධිපති වරයා කිසියම් හදිසි කටයුත්තක් සඳහා ටික වේලාවකට පිටතට ගොස් සිටි අවස්ථාවක කාර්යාලයේ කටයුතු කරමින් සිටි තැපැල් සේවකයා රැඳී සිටි කවුන්ටරය අභියසට එක් වයෝවෘධ විදේශිකයෙකු පැමිණ තමාට අවශ්‍ය දේ පිළිබඳව විමසන්නට විය. ඉංග්‍රීසි බස හැසිරවීමේ එතරම් පලපුරුද්දක් නැති බැවින්, විදේශිකයාගේ උච්චාරණ විලාශය ඇසූ සැණින් අන්දුන්කුන්දුන් වූ සේවකයා ඔහුගෙන් බේරීමේ උපක්‍රමයක් වශයෙන් " කෙටියෙන් " පිළිතුරු දී ඇගබේරා ගැනීමේ සටනක නිරතවිය.

" Fifty rupee stamps ........" ?

විදේශිකයා ඇසූ දේ යන්තමින් අවබෝධ කරගත හැකිවූ බැවින් මෙසේ පිළිතුරු දුන්නේ ගනුදෙනුව ඉක්මනින්ම අවසන් කරගැනීමේ අභිලාෂයෙනි.

" No...." - ඒ පිළිතුරය.
" Post Cards ...... ? "
" No ........... "
" Picture Cards ..... ? "
" No .......... "
" Air Mail covers .....? "
" No ......No........"

මෙයින් කෝපයට පත් විදේශිකයා වටපිට බලමින් " What the hell ......I want to make a complain - who is the Postmaster ......? " යනාදී වශයෙන් උස්හඬින් විමසන්නට වූ අතර, ඒ ඇසූ සේවකයා භ්‍රාන්තව මොහොතක් බලා සිටියේ, ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරදෙන්නේ කෙසේදැයි විමතියෙනි. කෙසේ වුවද, විදේශිකයා කියූ දෙයින් **අවසානයට කී වැකිය** යන්තමින් අවබෝධ කරගත් සේවකයා එම ප්‍රශ්නයටම ගැලපෙන පරිදි තම පිළිතුරද මෙසේ දෙන්නට සමත්විය.

" I **is** the postmaster........ "

සේවකයා තමාම පෙන්වා ගනිමින් සාඩම්බර ලීලාවෙන් පිළිතුරු දුන්නේය. එම පිළිතුර අසා දැඩි විමතියකට පත් විදේශිකයා උපහාසාත්මක බැල්මක් හෙලමින්, හිසද දෙපසට හරවමින් මෙසේ කියන්නට විය.

" ......Oh.......my god ..... You **are** the postmaster.....?

ඒ ඇසූ සේවකයාගේ එඩිතර පිළිතුර මෙසේ විය !



" Yes, I **are** .......! "

ගාමිණි චන්ද්‍රසේන
**(මෙම කතාවේ මූලාශ්‍රය - අම්බලන්ගොඩ එස්.එම්.පී.සිල්වා හිතවතාගෙන)**
011 2963518

Points to Ponder

# Radhakrishnan's idea

Radhakrishnan attended the sessions of the Indian philosophical congress held in 1931, 1932 and 1933 at Patna, Mysore and Poona respectively. He was also the general president of its 1932 session. The 1934 session of the congress was held in Andra University. While welcoming the delegates, as the chairman of the committed, he said:

Oscar Wilde has a great short story, which reads thus:

Christ came to a white plain from purple city and as he passeed through the first street, he heard voices overhead and saw a young man lying drunk on a window-sill and said: "Why do you waste your soul in drunkenness ? " He said "Lord, I was a leper and you healed me; what else can I do?"

A little further through the town he saw a young man following a harlot and said: " Why do you dissolve your soul in debauchery? " and the young man answered: Lord, I was blind and you healed me; what else can I do ?"

At last in the middle of the city he saw an old man crouching, weeping upon the ground and when he asked him why he wept, the old man answered " Lord I was dead and you raised me to the life, what else can I do? " Here the story ends.

If Jesus should visit us today and find that we are comfort minded and have taken to worship of the most monstrous illusions like militant nationalism and pouring molten steel in to veins of innocent youth that it may be used to undreamed of heights in mutual destruction and ask: " why do you indulge after so many centuries of civilization, in human sacrifices on this colossal scale ? Our answer should be :

"LORD YOU GAVE US EYES BUT NO SIGHT; YOU GAVE US BRAINS BUT NO SOUL; YOU GAVE US SCIENCE BUT NO PHILOSOPHY "

S.Radhakrishnan- His life and ideas by K.Satchidananda Murty and Ashoke Vohra PAGE 73

**Submitted by : Jinadasa Herath**
**077 - 2132750 / 011 - 2912007**

---

Points to Ponder

# TEN COMMANDMENTS OF QUALITY SERVICE

1. ***Speak to people*** there is nothing as nice as a cheerful greeting
2. ***Smile*** It takes 72 muscles to frown - only 14 to smile ......
3. ***Call People by name*** Everyone is pleased when you remember their name.....
4. ***Be friendly & helpful*** and others will respond in like manner .......
5. ***Speak & act.*** as if everything you do were a genuine pleasure....
6. ***be genuinely*** interested in people .....
7. ***Be generous*** with praise - Cautious with criticism ......
8. ***Be considerate*** with the feelings of others, it will be appreciated.....
9. ***Be thoughtful*** of the opinions of others, there are 3 sides to any controversy- yours, the other person's & the right one ?
10. ***Be willing*** to give service, what counts most in life is what we do for others....

**-E.J. -**

## Next Volume

Please forward all your writings including articles, poems, stories, comedies etc., filled with your emotions, feelings, knowledge and creativity for the next volume of "sandewa".

With that if you can send a recently taken Photograph of yourself with mentioning your name, it will be highly appreciated.

Editor

56/5.
"Amara-Mal"
Galthude,
Panadura.
038-2234226

### මීළඟ කලාපයට.....

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියූ ඔබගේ ලිපි, කාව්‍ය, ප්‍රබන්ධ සහ හස රස බස් සහිත රචනා, කෙටියෙන් හා පැහැදිලිව ලියා 'සැදෑව' වෙත ඉක්මනින්ම යොමු කරන්න.

එම නිර්මාණ සමඟ ඔබගේ නම සඳහන් කරන ලද, මෑතකදී ගනු ලැබූ ඡායාරූපයක් ද එවන්නේ නම් මැනවි.

- සංස්කාරක -


# සැදෑව

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2013 ජූලි / සැප්. කලාපය.



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක : QD/55/News/2013 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




Mr.L P W Lakshman De Silva (3511)
234/01/22, SheratonPark
Kopiyawatta,
Ragama.

ගරු ලේකම්,
මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,
8/1, ග්‍රීන් පාත්, කොහුවල.

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 58 දරණ ස්ථානයේ පිහිටි
ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයීය මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.